අධ්‍යක්ෂක පණිවිඩය ........ 1

**01 පරිච්ඡේදය** - ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම ........ 3

1.1.1 මිනුම් විද්‍යාව ........ 3

1.2. දෙපාර්තමේන්තුව හා එහි කාර්යභාරය ........ 4

1.3. ආයතනය පිහිටුවා ඇති නෛතික රාමුව ........ 5

1.4. ආයතනයේ පරමාර්ථ ........ 5

1.5. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු ........ 6

1.6. ප්‍රධාන කාර්යයන් ........ 6

1.7. සංවිධාන ව්‍යුහය ........ 20

1.8. දිස්ත්‍රික් කාර්යාල වල සම්බන්ධතා තොරතුරු ........ 22

1.9. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ........ 23

**02 පරිච්ඡේදය** - ප්‍රගතිය

2.1. ජාතික මිනුම් පර්යේෂණාගාරය තුල මිනුම් අන්වේශණතාව ස්ථාපනය කිරීම ........ 27

2.2. අන්තර් විද්‍යාගාර සංසන්දනය සඳහා සහභාගී වීම ........ 27

2.3. සංවර්ධන කටයුතු 2021 ........ 28

2.4. ජාතික මිනුම් පර්යේෂණාගාරය මගින් පැවැත්වූ පුහුණු හා උපදේශන වැඩසටහන් 2021 ........ 28

2.5. ජාත්‍යන්තර සබඳතාවල ප්‍රගතිය 2021 ........ 29

2.6. ජාතික මිනුම් පර්යේෂණාගාරයේ අංකශෝධන ආදායම් තොරතුරු ........ 31

2.7. ජාතික මිනුම් පර්යේෂණාගාරයේ පෙර ඇසුරුම්, වායු විමෝචන හා වේගමාපක උපකරණ ආදායම ........ 35

2.8. පඩි, මිමි, කිරුම් හා මිනුම් උපකරණ මාදිලි අනුමැතිය 2021 වර්ෂය ........ 35

2.9. සත්‍යායන ආදායම් 2018 සිට 2021 දක්වා ........ 36

2.10. සත්‍යායනය කරන ලද ඒකක සංඛ්‍යාව 2018 - 2021 ........ 37

2.11. වැටලීම් හා නඩු ප්‍රමාණය 2020 - 2021 ........ 39

2.12. දැනුවත් කිරීමේ වැඩසටහන 2021 ........ 42

2.13. දැනුවත් කිරීමේ වැඩසටහන් වල කාර්තුමය ප්‍රගතිය 2021 වර්ෂය ........ 43

2.14. වාණිජ ක්‍රියාකාරකම්වල නියැලෙන පෞද්ගලික ව්‍යවසායකයින්ගේ ව්‍යාප්තිය 2021 ........ 44

2.15. වාණිජ ක්‍රියාකාරකම්වල නියැලෙන පෞද්ගලික ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම 2021 වර්ෂය ........ 45

**03 පරිච්ඡේදය -** සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (ඒකාබද්ධ අරමුදල) ........ 47

3.2. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල) ........ 54

3.3. විගණකාධිපති වාර්තාව ........ 60

**04 පරිච්ඡේදය -** කාර්ය සාධන දර්ශකය

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ........ 79

**05 පරිච්ඡේදය -** තිරසාර සංවර්ධන අරමුණු (SDG)

5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු ........ 80

**06 පරිච්ඡේදය -** මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය - කාර්ය මණ්ඩල සංයුතිය 2021 ........ 84

6.2. මානව සම්පත් සංවර්ධනය ........ 87

**07 පරිච්ඡේදය -** අනුකූලතා වාර්තාව ........ 89

## අධ්‍යක්ෂතුමාගේ නිවේදනය

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඔබ වෙත සාදරයෙන් පිළිගන්වමු. 2021 වර්ෂය ගෝලීය වසංගතයේ උච්ඡතම තත්වයක් යටතේ වුවත්, දෙපාර්තමේන්තුවේ බොහෝ අරමුණු වල සංක්‍රාන්තික හා ප්‍රගතියක් ඇතිකළ කාල පරිච්ඡේදයක් විය. අපි අඛණ්ඩව නව්‍යකරණයන් සිදු කළ අතර, වසංගත තත්වයට අදාල සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව මිනුම් විද්‍යාව හා සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් ශක්තිමත් කළෙමු. අපි අපගේ ක්‍රියාමාර්ග සහ මෙහෙයුම් විධිමත් කළ අතර එම කැපවීම ශක්තිමත් භෞතික හා මූල්‍ය ප්‍රගතියකට දායක විය. අපගේ දැක්ම වන්නේ මනා ලෙස සුරැකි පාරිභෝගික ප්‍රජාවක් සඳහා නිවැරදි හා විශ්වාසනීය මිනුම් ලබා දීමයි. අප මේ වන විට දළ වශයෙන් රුපියල් මිලියන 400ක වාර්ෂික ඉපැයීම් සහිත ආයතනයක් වන අතර 300 කට ආසන්න සංඛ්‍යාවක්ගෙන් සමන්විත විනයගරුක කාර්ය මණ්ඩලයකින්ද සමන්විතය.

වෙනත් ඕනෑම රටක මෙන්, ශ්‍රී ලංකාවේ මිනුම් ක්‍රමයටද විද්‍යාත්මක මිනුම් විද්‍යාව, කාර්මික මිනුම් විද්‍යාව සහ නෛතික මිනුම් විද්‍යාව යන මට්ටම් තුනක් ඇත. මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව (MUSSD) යනු ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් විද්‍යා ආයතනය වන අතර මෙම මට්ටම් තුනම මෙම එකම ආයතනයට ගොනුකර ඇත. MUSSD මධ්‍යම මිනුම් විද්‍යා අධිකාරියක කාර්යභාරය ඉටු කරන අතර එයට විද්‍යාත්මක මිනුම් විද්‍යාව හා නෛතික මිනුම් විද්‍යාව මෙන්ම කාර්මික මිනුම් විද්‍යාව සම්බන්ධීකරණය කිරීමේ බලය ද ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් ප්‍රමිතීන් ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ ව්‍යාප්ත කිරීම ක්‍රියාත්මක කරනු ලබන්නේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති ජාතික මිනුම් විද්‍යාගාරය විසිනි.

1995 අංක 35 දරණ පනත ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 2015 දෙසැම්බර් මාසයේදී හෝමාගම, පිට්පන යෝජිත තාක්ෂණ නගරයේ ස්ථාපිත කරනු ලැබූ මෙම දෙපාර්තමේන්තුවේ ජාතික මිනුම් පර්යේෂණාගාරය, සහ පරිපාලන ගොඩනැගිලි ඇතුළත් නව ගොඩනැගිලි සංකීර්ණය ශ්‍රී ලංකාවේ ඉහළම මිනුම් විද්‍යා අධිකාරිය ලෙස, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ජාතික මිනුම් ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සහ ස්ථාපිත කිරීම සිදුකරන අතර ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය සහ ප්‍රමිතිය නංවාලීම සඳහා වන මිනුම් මත පදනම් වූ නියාමන හා සේවා ක්‍රියාකාරකම් තුළින් නිෂ්පාදකයින්, වෙළෙඳුන්, මිනුම් හා වෙනත් සේවා සපයන්නන් සහ පාරිභෝගිකයින් සඳහා යුක්තිය සහ සාධාරණත්වය සහතික කරයි.

ශ්‍රී ලංකා රජය විසින් ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් ආංශික උපාය මාර්ග 9 කින් සමන්විත "සෞභාග්‍යයේ දැක්ම" නමින් ජාතික උපායමාර්ගික සැලැස්මක් ඉදිරිපත් කර තිබේ. ගෝලීය තත්ත්වය සහ විවිධ සමාජ ආර්ථික අංශවල වර්තමාන තත්ත්වය දෙස සම්පව බැලීමෙන් පසුව, මෙම එක් එක් අංශයන්හි සිදු කළ යුතු අත්‍යාවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් හඳුනා ගැනීමට අපට හැකි වී තිබේ. දිළිඳුකම පිළිබඳ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කයන්ට අනුකූලව "ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්" සඳහා වන උපාය මාර්ග සඳහා මිනුම් විද්‍යාව විශාල කාර්යභාරයක් ඉටු කරන බව මෙහිදී අප විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව, කොවිඩ් -19 වසංගතයේ උච්ඡතම අවස්ථාවන්හිදී ආර්ථිකයේ ආහාර අංශය පුනර්ජීවනය කිරීම සඳහා අප විසින් විශේෂ අවධානයක් යොමු කළ අතර, ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළඳාමේ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා එය තවදුරටත් සිදුකර ගෙන යනු ඇත.

මෙම වසර තුල ලබාගත් ජයග්‍රහණ පිළිබඳ ආඩම්බර වන අතර ඒවා මෙම වාර්ෂික වාර්තාව මගින් පිළිබිඹු වනු ඇත.

එස්.එන්.අකුරන්තිලක
මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධ්‍යක්ෂ

# මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
# කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් වාර්තාව - 2021

# 1
# ආයතනික පැතිකඩ

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූලික ප්‍රතිපත්තිය, ක්‍රියාත්මක ව්‍යාපෘතීන් සහ වැඩසටහන් හා 2021 වසර තුළ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව දැනුම් දීම මෙම වාර්තාවේ අරමුණයි.

## 1.1. හැඳින්වීම

### 1.1.1.මිනුම් විද්‍යාව

මිනුම් පිළිබඳව හැදෑරීමේ විෂය සහ යෙදීම් මිනුම් විද්‍යාව ලෙස හැඳින්වේ. ස්කන්ධය, දිග, කාලය, පරිමාව, විදුලි ධාරාව, විද්‍යුත් ප්‍රතිරෝධ ආදී නොයෙක් රාශීන්ට අදාල මිනුම් එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවලදී අපට අවශ්‍ය වේ. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් භෞතික රාශි සහ මිනුම් ඒකකවල ඒකමිතියක් පවත්වාගෙන යාම සඳහා කරනු ලබන විද්‍යාත්මක පර්යේෂණ සහ නියාමන ක්‍රියාකාරකම් මිනුම් විද්‍යාව ලෙස අර්ථ දැක්විය හැකිය.




රූප සටහන 1: මිනුම් විද්‍යාවේ කාණ්ඩ

ඉහත සඳහන් ලෙස මිනුම් විද්‍යාව ප්‍රධාන වශයෙන් උප ක්ෂේත්‍ර තුනකට බෙදිය හැකිය. සෑම රටකම ජාතික මිනුම් පද්ධතියක් අර්ථ දක්වා ඒවා ජාතික මිනුම් ප්‍රමිතීන් වශයෙන් එරට තුළ ස්ථාපනය කිරීම, පවත්වාගෙන යාම හා විසුරුවා හැරීම පිළිබඳ වගකීම දරන ආයතනයක් ඇත. එය පොදුවේ එක් එක් රටේ ජාතික මිනුම් ආයතනය (National Metrology Institute) ලෙස හඳුන්වනු ලැබේ. ශ්‍රී ලංකාවේ එම වගකීම දරන්නේ ***මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවයි.***

## 1.2 දෙපාර්තමේන්තුව හා එහි කාර්යභාරය

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව (MUSSD) 1995 අංක 35 දරණ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනත යටතේ ස්ථාපිත කරන ලදී. දෙපාර්තමේන්තුව අයත් වන්නේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයටයි.

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් මස උද්‍යාන පාර, කොළඹ 05 පිහිටි පැරණි පරිශ්‍රයේ (පර්චස් 135 ක භූමි ප්‍රමාණයකින්) සිට ඉඩම් අවකාශ ප්‍රමාණවත් නොවීම සහ ජාතික අවශ්‍යතා හා මිනුම් විද්‍යා ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධනය උදෙසා පිටිපන, මාහේනවත්ත, හෝමාගම ලිපිනයේ පිහිටි තාක්ෂණ නගරයෙහි විද්‍යා මධ්‍යස්ථානය වෙත මාරු වී ඇත.







රූප සටහන 2 : තාක්ෂණ නගරයේ (Tech City) පිහිටීම (Source: Innovation hub of Asia- Tech City Sri Lanka Western Region Tech City Development Project)

1995 අංක 35 දරණ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් නිරවද්‍ය මිනුම් ක්‍රම හා මිනුම් විද්‍යා සේවාවන් සැපයීම, අදාල නීති හා රෙගුලාසි පැනවීම තුළින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම, අන්තර්ජාතික මිනුම් පද්ධතියට අනුකූලව ජාතික මිනුම් ප්‍රමිතීන් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම ආදිය පිළිබඳව දෙපාර්තමේන්තුව වගකීම දරයි.

1995 අංක 35 දරණ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනතේ II කොටසේ (3) වගන්තියට අනුව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව තුළ ඇති පර්යේෂණාගාරය ජාතික මිනුම් පර්යේෂණාගාරය ලෙස හැඳින්වේ. එකී පනතේ III වන කොටස අනුව ජාතික මිනුම් ප්‍රමිති ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ බෙදා හැරීම, IV වන කොටස අනුව වෙළඳාමේ මිනුම් භාවිතය සහ V සහ VI කොටස් අනුව කර්මාන්ත ක්ෂේත්‍රයේ භාවිතය පිළිබඳව දෙපාර්තමේන්තුව වගකිව යුතුය. මේ අනුව දෙපාර්තමේන්තුව විද්‍යාත්මක මිනුම් විද්‍යාව, කාර්මික මිනුම් විද්‍යාව සහ නෛතික මිනුම් විද්‍යාව යන අංශ තුනකින් සමන්විත ජාතික මිනුම් පද්ධතිය සඳහා (National Measurement System) වගකිව යුතුය.

දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති ජාතික මිනුම් පර්යේෂණාගාරය (National Measurement Laboratory) මඟින් ශ්‍රී ලංකාව තුළ භාවිත මිනුම් හා සම්බන්ධ ජාතික ප්‍රමිතීන් හඳුනාගෙන ඒවා අර්ථ දක්වා ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම හා විසුරුවා හැරීම සිදු වේ. මීට අමතරව කර්මාන්ත, ඉංජිනේරු, පාරිසරික, සෞඛ්‍ය රැකවරණය, මහමඟ ආරක්ෂාව ආදී ක්ෂේත්‍ර වලදී භාවිතා කරන මිනුම් උපකරණ අංකශෝධනය කිරීම හා සත්‍යායනය කිරීම ද පර්යේෂණාගාරය මගින් සිදු කරනු ලැබේ.

නෛතික මිනුම් විද්‍යා කාර්යයන් සඳහා නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (OIML) නිර්දේශ භාවිතා කරන අතර එම නිර්දේශවලට අනුකූලව කිරුම් මිනුම් උපකරණවල මාදිලි අනුමත කිරීම, මූලික හා වාර්ෂික සත්‍යායනය කිරීම සිදුකරනු ලැබේ.






රූප සටහන 3 : මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

## 1.3 ආයතනය පිහිටුවා ඇති නෛතික රාමුව

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව (MUSSD) **1995 අංක 35 දරණ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනත**

## 1.4 ආයතනයේ පරමාර්ථ

ජාත්‍යන්තර මිනුම් පද්ධතිය අනුව ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් පද්ධතිය ස්ථාපනය කිරීම හා නියාමනය කිරීම.

## 1.5 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

**දැක්ම**

***“මනා ලෙස සුරැකි පාරිභෝගික ප්‍රජාවක් සඳහා නිවැරදි හා විශ්වාසනීය මිනුම්”***

**මෙහෙවර**

***“මිනුම් මත පදනම් වූ සේවා හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, වෙළෙන්දන්, මිනුම් විද්‍යා හෝ වෙනත් සේවා සපයන්නන් සහ පාරිභෝගිකයන්ගේ සමානාත්වය හා යුක්තිය තහවුරු කරන ජාත්‍යාන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික මිනුම් ප්‍රමිතීන් ස්ථාපනය කිරීම, පවත්වාගෙන යාම හා ඒවා ප්‍රචලිත කිරීම මගින් ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම”***

**අරමුණු**

***“ශ්‍රී ලංකාවේ මිනුම් විද්‍යාව පිළිබඳ ප්‍රමුඛතම ආයතනය ලෙස ක්‍රියාකිරීම හා 1995 අංක 35 දරණ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත ක්‍රියාත්මක කිරීම තුළින් රටෙහි විද්‍යාත්මක මිනුම් විද්‍යාව, කාර්මික මිනුම් විද්‍යාව හා නෛතික මිනුම් විද්‍යාවට සම්බන්ධ යටිතල පහසුකම් දියුණු කිරීමට අවශ්‍ය මූලික දායකත්වය ලබාදීම.”***

## 1.6 ප්‍රධාන කාර්යයන්

**“ශ්‍රී ලංකාවේ මිනුම් විද්‍යාව සඳහා වන ඉහළම ආයතනය ලෙස මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (MUSSD) පහත කාර්යයන් වල වගකීම දරයි”**

### 1.6.1 විද්‍යාත්මක මිනුම් විද්‍යාව

මිනුම් විද්‍යාවේ වැදගත්ම ක්ෂේත්‍රය මෙය වේ. විද්‍යාත්මක මිනුම් විද්‍යාව යනු මිනුම් ඒකක පද්ධති හා රාශි පද්ධති පිහිටුවීම, මිනුම් විද්‍යාව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, නව මිනුම් ක්‍රම සොයාගැනීම, ජාත්‍යන්තර හා ජාතික මිනුම් ප්‍රමිතීන් හඳුනා ගැනීම, අර්ථ දැක්වීම, පිහිටුවීම හා එම ප්‍රමිතීන්වල ඒකමිතිය පවත්වා ගනිමින් ඒවා භාවිතා කරන්නන් වෙත ව්‍යාප්ත කිරීම පිළිබඳ විෂය ක්ෂේත්‍රයයි. එමෙන්ම මිනුම් දෝෂ හඳුනා ගැනීම හා නිරවුල් කිරීම ආදිය සඳහා බලපාන සිද්ධාන්තික හා ප්‍රායෝගික කරුණු ද විද්‍යාත්මක මිනුම් විද්‍යා ක්ෂේත්‍රය මගින් ආවරණය වේ.

විද්‍යාත්මක මිනුම් විද්‍යාවට අදාල ඉහත කාර්යයන් ඉටුකිරීම සඳහා ගෙන ඇති පියවර කිහිපයකි.

01. ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවීම මගින් මිනුම් ඒකක හා ජාතික මිනුම් ප්‍රමිති පද්ධතිය හා මිනුම් ඒකක ක්‍රමය ස්ථාපනය කිරීම.
02. ජාතික මිනුම් ප්‍රමිතීන් නිරූපණය, ස්ථාපනය, පවත්වාගෙන යාම හා ව්‍යාප්ත කිරීම.
03. ජාත්‍යන්තර මිනුම් ප්‍රමිතීන්හි උපයෝගීතාවට අනුකූල වන පරිදි ජාතික මිනුම් ප්‍රමිතීන් ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යාම.
04. විවිධ ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වන මිනුම් පරාමිතීන් හා තාක්ෂණය ව්‍යාප්ත කිරීම හා ප්‍රවර්ධන කටයුතු.

05. මිනුම් රාශීන්ට අදාල දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ ද්විපාර්ශවික හා බහුපාර්ශවික සංසන්දන වැඩසටහන් පවත්වමින් අංකශෝධනය හා මිනුම් ශක්‍යතා ඉහළ නැංවීම.
06. මිනුම් විද්‍යා පර්යේෂණ කටයුතු.
07. ශ්‍රී ලංකාවේ සම්මත වේලාව පවත්වාගෙන යාම හා www.sltime.org වෙබ් අඩවිය ඔස්සේ විකාශනය කිරීම.

### 1.6.1.1 ජාතික මිනුම් පර්යේෂණාගාරය

ජාතික මිනුම් ඒකක ක්‍රමය ස්ථාපනය, අංකශෝධන හා පරීක්ෂණ විද්‍යාගාර, නියාමන ආයතන, කර්මාන්ත හා නෛතික මිනුම් විද්‍යා ක්ෂේත්‍ර සඳහා අන්වේෂණය (Traceability) පවත්වාගෙන යාම හා ව්‍යාප්ත කිරීම සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව හෝමාගම, පිටිපන, මාහේනවත්තෙහි පිහිටි එහි නව පරිශ්‍රයෙහි විද්‍යාගාර කාමර 66 ක් සහිතව ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවා ඇත. වර්තමානයේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මිනුම් ක්ෂේත්‍ර 11 ක් සඳහා විද්‍යාගාර පවත්වාගෙන යයි.

**ජාතික මිනුම් පර්යේෂණාගාරය**

| විද්‍යාගාරය | විද්‍යාගාර ප්‍රධානී | දුරකතන අංක |
|---|---|---|
| **ස්කන්ධය** | ආර්.ඩී.එම්.අලංක මහතා | 0112-182262 |
| **මානමිතිය** | ඒ.ඩී.ඩී.නමින්ද මහතා | 0112-182267 |
| **කාලය හා සංඛ්‍යාතය** | ආර්.ජී.එස්.ඒ.පෙරේරා මහතා | 0112-182265 |
| **සරලධාරා විද්‍යුතය** | ආචාර්ය ජී. ඩබ්. සී. විජයසුන්දර මෙය /ආර්.ජී.එස්.ඒ.පෙරේරා මහතා | 0112-182265 |
| **උෂ්ණත්වය** | එස්.එන්.අකුරන්තිලක මහතා | 0112-182253 |
| **පීඩනය** | ජේ.එස්.එම්.සිල්වා මිය | 0112-182264 |
| **පරිමාමිතික** | එච්.එල්.අයි.එස්. සම්පත් මහතා | 0112-182266 |
| **විද්‍යුත් ජවය හා ශක්තිය** | ආර්.ඩී.එම්.අලංක මහතා | 0112-182262 |
| **රසායනික මිනුම්** | එස්.ඩී.අයි.ඩයස් මහතා | 0112-182258 |
| **වායූන් පිළිබඳ මිනුම්** | ආර්.ජී.එස්. ඒ.පෙරේරා මහතා | 0112-182265 |
| **තෙතමනය හා ආර්ද්‍රතාවය** | කේ.එස්.මල්ලවආරච්චි මිය | 0112-182263 |

වගුව අංක 1

**ජාතික මිනුම් පර්යේෂණාගාරය - ප්‍රමිතීන්**

| මිනුම | ප්‍රාථමික/ද්විතීයික ප්‍රමිති |
|---|---|
| **ස්කන්ධය** | කිලෝග්‍රෑම් 1 හි ජාතික මූලාදර්ශය<br>1 mg සිට 20 kg දක්වා E1 ශ්‍රේණියේ පඩි කට්ටලය |
| **දිග** | He/Ne ලේසර් ආලෝකය<br>K ශ්‍රේණියේ ආමාන කුට්ටි<br>• K වානේ 0.5 mm සිට 100 mm දක්වා<br>• K වානේ 400 mm, 500 mm<br>• K ටංග්ස්ටන් කාබයිඩ් 0.5 mm සිට100 mm දක්වා<br>• K ටංග්ස්ටන් කාබයිඩ් 1 mm සිට 100 mm දක්වා විශේෂ<br>00 ශ්‍රේණියේ ආමාන කුට්ටි<br>• 00 සෙරමික් 0.5 mm සිට 100 mm දක්වා<br>• 00 ටංග්ස්ටන් කාබයිඩ් 0.5 mm සිට 100 mm දක්වා<br>0.1 mm සූක්ෂම රේඛා පරිමාණ |
| **කාලය හා සංඛ්‍යාතය** | සීසියම් (Cs) ප්‍රාථමික සංඛ්‍යාත ප්‍රභවය, රුබීඩියම් (Rb) ප්‍රාථමික සංඛ්‍යාත ප්‍රභවය |
| **උෂ්ණත්වය** | රසදිය (Hg) ත්‍රික ලක්ෂයේ සිට ඇලුමිනියම් (Al) ඝනීකරණ ලක්ෂය (-38.834 $^0$C සිට 660.323 $^0$C දක්වා) අවල ලක්ෂ්‍ය 7ක් |
| **සරලධාරා විද්‍යුතය** | පරිවර්තන ප්‍රමිතීන් (1000 V සහ 20 A දක්වා)<br>සෙනර් වෝල්ටීයතා ප්‍රමිතීන් 1 V, 10 V<br>ප්‍රතිරෝධ පිළිබඳ ප්‍රමිතීන් 1 GΩ දක්වා |
| **පීඩනය** | 200 MPa දක්වා ද්‍රවපීඩක පීඩන තුලාව<br>7 MPa දක්වා වායු පීඩන තුලාව<br>175 KPa දක්වා වායු පීඩන තුලාව |
| **පරිමාව** | මයික්‍රොපිපෙට්ටු අංකශෝධනය - ස්කන්ධමිතික ක්‍රමය (1 µL to 1 mL)<br>පරිමාමිතික උපකරණ ක්‍රමාංකනය - ස්කන්ධමිතික ක්‍රමය (1 mL - 500 L)<br>පරිමාමිතික උපකරණ ක්‍රමාංකනය - පරිමාමිතික ක්‍රමය (2 L - 5000 L) |
| **විද්‍යුත් ජවය හා ශක්තිය** | විද්‍යුත් ජවය හා ශක්තිය පිළිබඳ සංසන්දකය (10 mA to 120 A දක්වා, 300V)<br>MTE K2006 Three phase comparator (0.01%) |
| **රසායනික මිනුම්** | ද්විතීය ප්‍රමිති ස්වාරක්ෂක ද්‍රාවණ (Secondry Buffer Solutions)- pH-0-14<br>රුධිරයේ මධ්‍යසාර ප්‍රමිති ද්‍රාවණ<br>(Reference Solutions - Alcohol in blood )- 50 mg/100 mL,80 mg/100 mL, 150 mg/100 mL<br>ද්විතීය ප්‍රමිති සන්නායක හා ද්‍රාවණ<br>( Secondry Conduetivity Solutions) 84 mg/cm, 1413 mg/cm,12.9 mg/cm , 111.8 mg/cm |
| **ආර්ද්‍රතාමිතික** | ආර්ද්‍රතාමිතික කුටීර (-40 $^0$C – 180 $^0$C)<br>ආර්ද්‍රතාවය මැනීමේ උපකරණ (10 % - 90 % RH) |

වගුව අංක 2

### 1.6.1.2. මිනුම් අන්වේශණතාව (Measurement Traceability) ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකාව තුළ මිනුම් සඳහා මිනුම් අන්වේශණතාව (Measurement Traceability) ස්ථාපිත කිරීම ජාතික මිනුම් පර්යේෂණාගාරයේ වගකීමකි. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත අනුව ජාතික මිනුම් පර්යේෂණාගාරයේ පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ප්‍රමිති වෙනත් රටක ජාතික පර්යේෂණාගාරයක අංකශෝධනය කරනු ලබයි. එම විදේශීය ජාතික මිනුම් පර්යේෂණාගාරය ජාත්‍යන්තර පඩි හා මිමි කාර්යාංශයේ වෙබ් අඩවියේ මූලික සංසන්දන පිළිබඳ දත්ත සමුච්චිතයේ (Key Comparison Data Base) හි අංකශෝධන හා මිනුම් පිළිබඳ ශක්‍යතා අගයන් (Calibration and Measurement Capabilities) ප්‍රතිෂ්ඨාපනය කිරීම මඟින් අන්තර් ජාතික පිළිගැනීමට ලක්ව ඇති පර්යේෂණාගාරයක් වීම අවශ්‍යම කරුණකි.

### 1.6.1.3 අන්තර් සංසන්දනය සඳහා සහභාගී වීම (Inter Laboratory Comparisons)

අංකශෝධන හා පරීක්ෂණ කටයුතු සිදුකරනු ලබන විද්‍යාගාර වල මිනුම් අතර සමානාත්වතාවයක් පවත්වාගෙන යනු පිණිස අන්තර් සංසන්දනය පැවැත්වේ.

ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලබන මිනුම් අනෙකුත් රටවල්වල සිදුකරනු ලබන මිනුම් වල අගයන්ට සමාන බව පෙන්වාදීම සඳහා අන්තර් ජාතික මට්ටමින් පවත්වනු ලබන අන්තර් සංසන්දනය සඳහා ජාතික මිනුම් පර්යේෂණාගාරය සහභාගී වේ. මෙලෙස මෙරට තුල මිනුම් ලබාගැනීමේ නිපුණතාව ඔප්පුකිරීම ජාත්‍යන්තර වෙළඳාමේදී බලපැවැත්වෙන වෙළඳ බාධක අවම කරගැනීම සඳහා වැදගත් වේ. තවද මෙරට තුළ පවතින අංකශෝධන විද්‍යාගාර විසින් නිකුත් කරනු ලබන අංකශෝධන සහතිකවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා පවත්වනු ලබන දේශීය අන්තර් සංසන්දනය සඳහා ද ජාතික මිනුම් පර්යේෂණාගාරය දායකත්වය සපයයි.

### 1.6.1.4 ජාත්‍යන්තර ක්‍රමයේ ඒකක (SI) පවත්වා ගැනීම




2018 නොවැම්බර් 16 වන දින පැවති පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනයේ (CGPM) 26 වන සැසිවාරයේදී දැනට භාවිත වන SI මූල ඒකකවල අර්ථ දැක්වීම් සංශෝධනය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව කිලෝග්‍රෑමය, ඇම්පියර්, කෙල්වීනය සහ මවුලය යන මූල ඒකකවල අර්ථ දැක්වීම වෙනස් කරමින් SI ඒකක සංශෝධනය කිරීම සඳහා එකඟත්වයට පැමිණෙන ලදී .

මෙම තීරණය අනුව 2019 මැයි 20 ලෝක මිනුම් විද්‍යා දිනයේ සිට සියලුම SI ඒකක සඳහා ස්වාභාවික ලෝකය විස්තර කරන නියතයන් අනුව අර්ථ දක්වන ලද නව SI මූල ඒකක භාවිතා කිරීම ආරම්භ කර ඇත. මෙමගින් **SI** ඒකක පද්ධතියේ අනාගත ස්ථායිතාව සහතික කෙරෙන අතර ක්වොන්ටම් තාක්ෂණය ඇතුළු නව තාක්ෂණයන් භාවිතා කිරීමට අවස්ථාවන්ද විවෘත වේ. SI ඒකක අර්ථ දැක්වීම සඳහා භාවිතා වන නියතයන් හත පහත වගු අංක 3 හි දක්වා ඇත.

SI මූල ඒකක හතේ නව අර්ථ දැක්වීම්වලට යොදා ගන්නා මූලික භෞතික නියතයන්

| නියතය | සලකුණ | සංඛ්‍යාත්මක අගය | ඒකක |
|---|---|---|---|
| **Cs පරමාණුවේ භූමි අවස්ථාවේ අධි සූක්ෂම මට්ටම් අතර සංක්‍රමණයට අනුරූප විකිරණයෙහි කාලාවර්ත සංඛ්‍යාව** | $\Delta V_{Cs}$ | 9 192 631 770 | Hz |
| **රික්තකයේදී ආලෝකයේ වේගය** | c | 299 792 458 | $m\ s^{-1}$ |
| **ප්ලාන්ක් නියතය** | h | $6.626\ 070\ 15 \times 10^{-34}$ | J s |
| **මූලික ආරෝපණය** | e | $1.602\ 176\ 634 \times 10^{-19}$ | C |
| **බෝල්ට්ස්මාන් නියතය** | k | $1.380\ 649 \times 10^{-23}$ | $J\ K^{-1}$ |
| **ඇවගාඩ්රෝ නියතය** | $N_A$ | $6.022\ 140\ 76 \times 10^{23}$ | $mol^{-1}$ |
| **ප්‍රදීපන සඵලත්වය** | $K_{cd}$ | 683 | $lm\ W^{-1}$ |

වගුව අංක 3

### 1.6.1.5 ශ්‍රී ලංකාවේ සම්මත වේලාවේ නිපදවීම සහ විකාශය

ශ්‍රී ලංකාවට සම්මත වේලාව සැපයීමේ පුරෝගාමියා වීමේ ගෞරවය 2011 වසරේ සිට හිමිවන්නේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවටයි. දිවයින පුරා කාලය පිළිබඳ ඒකමිතියක් ඇති කරනු පිණිස ජාතික මිනුම් පර්යේෂණාගාරයේ විද්‍යුත් කාලය හා සංඛ්‍යාත විද්‍යාගාරයේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවේ සම්මත වේලාව නිපදවීමේ කටයුතු ආරම්භ කරන ලදි. ඒ සඳහා **රුබීඩියම් පරමාණුක ඔරලෝසුවක්** ස්ථාපිත කර එමගින් ජාත්‍යන්තර කාල කාණ්ඩාංකවලට අනුකූල වන පරිදි ශ්‍රී ලංකාවේ නිවැරදි වේලාව සකස් කර විකාශනය කිරීම සිදුවේ. නිවැරදි වේලාව විකාශනය සඳහා 2011 අප්‍රේල් මස www.sltime.org වෙබ් අඩවිය විවෘත කරන ලදි. දවසේ ඕනෑම වේලාවක මෙම වෙබ් අඩවියට පිවිස ශ්‍රී ලංකාවේ නිවැරදි වේලාව දැනගැනීමේ පහසුව දැන් ශ්‍රී ලාංකිකයන්ට ලැබී ඇත. මෙම වෙබ් අඩවිය ඇසුරෙන් තමන් භාවිතා කරන ඔරලෝසුවල වේලාව නිවැරදිව සකස් කර ගන්නා ලෙස අදාල සියලු පාර්ශවයකටම උපදෙස් දෙනු ලැබේ.

වර්තමානයේ කාලය මැනීමේ පද්ධතිය **සීසියම් ප්‍රාථමික සංඛ්‍යාත ප්‍රමිතියෙන්** සමන්විත වේ. කාල පද්ධතිය අංකශෝධනය කර ඇති අතර දැන් BIPM හි UTC (ජාත්‍යන්තර සම්මත වේලාව) තීරණය කිරීමට දායක වේ. අන්වේෂණය (Traceability) ලබා ගැනීම සමග කාල සම්බන්ධතාවය ස්ථාපිත කර ඇත. NTP (ජාල කාල ප්‍රොටොකෝලය) සේවාදායකයන්ට නිවැරදි වේලාව බෙදා හැරීම සඳහා ස්ථාපිත කර ඇත.

### 1.6.1.6 පර්යේෂණ හා සංවර්ධනය

ජාතික මිනුම් පර්යේෂණාගාරයේ ඇති විවිධ මිනුම් ප්‍රමිති පවත්වාගෙන යාම හා ව්‍යාප්ත කිරීම පිළිබඳ පරීක්ෂණ සිදු කරනු ලබන අතර එමගින් එම ප්‍රමිති වල තත්ත්වය තහවුරු කරගැනේ. තවද කර්මාන්ත සඳහා භාවිතා වන මිනුම් උපකරණ අංකශෝධන සඳහා ක්‍රමවේද සංවර්ධනයද නිරතුරුව සිදුවේ.

## 1.6.2 කාර්මික මිනුම් විද්‍යාවේ ක්‍රියාකාරකම්

කාර්මික මිනුම් විද්‍යාව යටතේ මිනුම් විද්‍යාව කර්මාන්ත හා නිෂ්පාදන කටයුතුවලදී යොදා ගන්නා ආකාරය පිළිබඳව සලකනු ලැබේ. මිනුම් උපකරණ භාවිතයේ යෝග්‍යතාව සහතික කරමින් ඒවා කර්මාන්ත ආදී ක්ෂේත්‍රවලදී යොදාගැනීමත්, මිනුම්වල තත්ත්ව පාලනය කටයුතු කිරීමත්, කාර්මික මිනුම් විද්‍යාවට අදාල වේ. එහිදී ගුණාත්මක නිෂ්පාදන ක්‍රියාවලියක අවශ්‍යතාවලට අනුකූලවන පරිදි කාර්මික අංකශෝධන කටයුතු හා මිනුම් උපකරණ කළමනාකරණ කටයුතු සිදු කරනු ලැබේ.

කාර්මික මිනුම් විද්‍යාවට අදාළ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන සේවා පහත පරිදි වේ.

1. කර්මාන්තවල නිෂ්පාදන ක්‍රියාවලියේ භාවිතා කරන පඩි, මිමි සහ කිරුම් හා මිනුම් උපකරණ අංකශෝධනය කිරීම (පරීක්ෂණාගාරය තුළ සහ බාහිර අංකශෝධනය ද ඇතුළත්ව)
2. නිෂ්පාදන හා සේවා කර්මාන්තවල පිහිටුවා ඇති විශාල පරිමාණයේ මිනුම් උපකරණ පද්ධති පරීක්ෂා කිරීම
3. කර්මාන්ත ආශ්‍රිත මිනුම්වලට අදාල මිනුම් ගැටලු විසඳීම පිළිබඳ පුහුණුව හා උපදෙස් සැපයීම

### 1.6.2.1 කාර්මික අංකශෝධනය

කාර්මික, ඉංජිනේරු හෝ වෙනත් ආශ්‍රිත ක්ෂේත්‍රවල භාවිතා වන පීඩනමාන, උෂ්ණත්වමාන, පඩි, තරාදි, දිග මැනීමේ උපකරණ, විදුලි මිනුම් උපකරණ, තෙතමනය මැනීමේ උපකරණ, පරීක්ෂණාගාර කිරුම් තරාදි ආදිය සඳහා අංකශෝධන පහසුකම් ජාතික මිනුම් පර්යේෂණාගාරය (NML) වෙතින් ලබා ගත හැකිය. එවැනි අංකශෝධන සඳහා සහතිකද නිකුත් කරනු ලැබේ.



කාර්මික අංකශෝධනය යනු ජාතික මිනුම් පර්යේෂණාගාරය (NML) විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන්ගෙන් එකකි. NML විසින් සපයනු ලබන අංකශෝධන විස්තර පහත දක්වා ඇත. අංකශෝධනය සඳහා වන ගාස්තු සංශෝධනය කිරීම 2015 ජූලි 2 දිනැති 1921/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව සිදුවන අතර එම ගාස්තු නැවත සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී.

<u>ජාතික මිනුම් පර්යේෂණාගාරය විසින් 2021 වර්ෂය අවසන් වන විට යාවත්කාලීන කරන ලද සේවා</u>

| | විද්‍යාගාරයේ නම | සපයනු ලබන අංකශෝධන සේවා |
|---|---|---|
| 1 | උෂ්ණත්වමිතික විද්‍යාගාරය  | 1.සායනික උෂ්ණත්වමාන<br>2.කාර්මික සහ විද්‍යාගාර උෂ්ණත්වමාන සංඛ්‍යාංක උෂ්ණත්වමාන<br>3.Dial thermometer probe<br>4.තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන සහ ප්‍රතිරෝධ උෂ්ණත්වමාන<br>5.වීදුරු ද්‍රව උෂ්ණත්වමාන<br>6.Maximum Registered උෂ්ණත්වමාන<br>7.උපරිම අවම උෂ්ණත්වමාන<br>8.බිත්ති උෂ්ණත්වමාන<br>9.පෘෂ්ඨවල උෂ්ණත්වය මැනීමේ උපකරණ<br>10.අධෝරක්ත උෂ්ණත්වමාන<br>11.සම්මත ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමාන (සංසන්දන ක්‍රමය)<br>12.ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමාන (අචල ලක්ෂ්‍ය ක්‍රමය)<br>13.කාර්මික තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන (සංසන්දන ක්‍රමය)<br>14.කාර්මික තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන (අචල ලක්ෂ්‍ය ක්‍රමය)<br>15.උෂ්ණත්වමිතික තාපක (ද්‍රව සහ වියළි)<br>16.උෂ්ණත්වමිතික රේඛයන් (Chart Recorder)<br>17.විද්‍යාගාර උඳුන් (Oven)<br>18.ඔටොක්ලේව්<br>19.ඉන්කියුබේටර සහ ජල තාපක<br>20.අධිශීතකරණ සහ ශීතකරණ (තනි කුටීර, කුටීර දෙක හෝ වැඩි)<br>21.ශීත කාමරය (කාමර උෂ්ණත්ව මිනුම්)<br>22.ශීත කාමරය (තාප ස්විච දර්ශක සහිත පද්ධති)<br>23.තාප ස්විච/පාලක |

| | | |
|---|---|---|
| 2 | විද්‍යුත් ජවය සහ ශක්තිය පිළිබඳ විද්‍යාගාරය<br> | 1.කිලෝ වොට් පැය මීටර (එකලා)<br>2.කිලෝවොට් පැය මීටර (තෙකලා)<br>3.කිලෝවොට් ඇම්පියර් පැය මීටර (තෙකලා)<br>4.ජංගම විද්‍යුත් බලය/ශක්තිය මැනීමේ උපකරණ (එකලා)<br>5.ජංගම විද්‍යුත් බලය/ ශක්තිය මැනීමේ උපකරණ (තෙකලා)<br>6.විදුලි මනු පරීක්ෂා කිරීමේ පද්ධතිවල මීටර (එකලා)<br>7.විදුලි මනු පරීක්ෂා කිරීමේ පද්ධතිවල මීටර (තෙකලා)<br>8.විද්‍යුත් ශක්ති මීටර (විද්‍යාගාර/ස්ථාවර/එකලා)<br>9.විද්‍යුත් ශක්ති මීටර (විද්‍යාගාර/ස්ථාවර/තෙකලා)<br>10.විද්‍යුත් බලය මැනීමේ උපකරණ (විද්‍යාගාර/ස්ථාවර/එකලා/ජංගම)<br>11.විද්‍යුත් බලය මැනීමේ උපකරණ (විද්‍යාගාර/ස්ථාවර/තෙකලා/ජංගම) |
| 3 | පරිමාමිතික විද්‍යාගාරය<br> | 1.බෙදුම් රහිත මිනුම්<br>2.පරිමාමිතික මිනුම්<br>3.මිනුම් සිලින්ඩර<br>4.විශාල පරිමා සහිත ටැංකි<br>5.මයික්‍රෝ පිපෙට්ටු, පිපෙට්ටු, බියුරෙට්ටු |

| | | |
|---|---|---|
| **4** | **පීඩන මිනුම් විද්‍යාගාරය**<br> | **ISO 17025:2017 අනුව ප්‍රතීතනය (Accreditation) කරන ලදි. පහත අංකශෝධන සේවාවන් සපයනු ලැබේ.**<br><br>**1.**වායු පීඩනමාන<br>**2.**ද්‍රව පීඩනමාන<br>**3.**රසදිය රුධිර පීඩනමාන<br>**4.**සංඛ්‍යාංක රුධිර පීඩන මාන<br>**5.**පරිසර පීඩන තත්වය මැනීමේ උපකරණ **(Barometric Pressure Measuring Devices)**<br>**6.**රික්තක පීඩනමාන **(-100**KPa) |
| **5** | **ස්කන්ධමිතික විද්‍යාගාරය**<br> | **1.**කිරුම් පඩි (OIML $E_2$, $F_1$, $F_2$, M )<br>**2.**කාර්මික කිරුම් පඩි (සුදු යකඩ / වෙනත්)<br>**3.**තරාදි - ඉලෙක්ට්‍රොනික / යාන්ත්‍රික (OIML නිරවද්‍යතා පන්තිය I,II,III,IV)<br>**4.**කඩදාසි තුලා<br>**5.**දොඹකර තුලා<br>**6.**එල්ලන තරාදි<br>**7.**පාලම් තරාදි<br>**8.**බොත්තම් අදින යන්ත්‍ර<br>**9.**හෝපර් තුලා |

| | | |
|---|---|---|
| 6 | මානමිතික විද්‍යාගාරය  | 1. ආමාන කුට්ටි<br>2. මිනුම් රූල්<br>3. මිනුම් ටේප්<br>4. කැලිපර්<br>5. මයික්‍රොමීටර<br>6. උස ආමාන<br>7. දර්ශක ආමාන<br>8. සණකම ආමාන<br>9. බෝර් ආමාන<br>10. ෆීලර් ආමාන<br>11. සමතල බව මැනීම<br>12. අන්වීක්ෂ<br>13. සමාන්තර බව මැනීම<br>14. රේඛා පරිමාණ |
| 7 | සරල ධාරා විද්‍යුතය පිළිබඳ විද්‍යාගාරය  | 1.වෝල්ට් මීටර<br>2.ඇමීටර<br>3.ඕම් මීටර<br>4.බහු මීටර<br>5.ප්‍රතිරෝධ |
| 8 | විද්‍යුත් කාලය සහ සංඛ්‍යාත මිනුම් විද්‍යාගාරය  | 1.කාලය/විරාම ඝටිකා<br>2.සංඛ්‍යාතය/ටැකෝ මීටර<br>3.දෝලනේක්ෂ<br>4.තරංග ජනක |

| | | |
|---|---|---|
| **9** | රසායනික මිනුම් විද්‍යාගාරය   | **1.**ඇල්කොහොල් විශ්ලේෂක (Alchoyzers)<br>**2.**පී.එච්.මීටර (pH meters)<br>**3.**සන්නායකතා මීටර (Conduetivity meters)<br>**4.**පරීක්ෂණාගාර සඳහා ප්‍රවීණතා පරීක්ෂණ (Proficiency Testing) පැවැත්වීම |
| **10** | තෙතමනය හා ආර්ද්‍රතාවය පිළිබඳ මිනුම් විද්‍යාගාරය  | **1.**සංඛ්‍යාංක ආර්ද්‍රතාමාන<br>**2.**තෙත් හා වියළි බල්බ ආර්ද්‍රතාමාන |
| **11** | වායු ප්‍රමිතීන් පිළිබඳ විද්‍යාගාරය  | **$O_2$, $CO_2$ , CO, HC** මනින මිනුම් උපකරණ |

වගුව අංක 4

## 1.6.3 නෛතික මිනුම් විද්‍යාවේ ක්‍රියාකාරකම්

නෛතික පාලනය යටතට ගැනෙන ක්ෂේත්‍රය නෛතික මිනුම් විද්‍යාව ලෙස හැඳින්වේ. එනම් මිනුම් හා මිනුම් උපකරණ භාවිතයේදී සපුරාලිය යුතු නෛතික අවශ්‍යතා පරීක්ෂා කර රටේ පවතින මිනුම් නීතිවලට අනුකූල බවට සහතික කිරීමේ ක්‍රියාවලියයි. ඒ සඳහා 1995 අංක 35 දරණ පනත මගින් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සපයා ඇත. ඒ අනුව සෞඛ්‍යය, කර්මාන්ත, මහජන ආරක්ෂාව, පරිසර ආරක්ෂණය, බදුකරණය, පාරිභෝගික රැකවරණය සහ සාධාරණ වෙළඳාම යන අංශ සැලකිල්ලට ගෙන පනවනු ලබන නීති හා රෙගුලාසි නියාමනය කිරීම සිදුවේ.

නෛතික මිනුම් විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාලව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන කාර්යයන් පනත සහ එහි ඇතුළත් නියෝග මගින් අර්ථකථනය කොට ඇත. සෑම වාණිජ කටයුත්තකදීම සිදු කරන කිරුම්, මිනුම් ආදිය මිනුම් නීතියට යටත්වේ. ඒ අනුව පහත සඳහන් නියාමන කාර්යයන් සිදුකිරීම සඳහා පනත මගින් දෙපාර්තමේන්තුවට බලය පවරා තිබේ.

01. තෘතියික ප්‍රමිති අංකශෝධනය කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් තෘතියික ප්‍රමිති පවත්වාගෙන යාම

    (මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතට අනුව සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙකුම මිනුම් ඒකක,ප්‍රමිති හා සේවා අධිකාරි තනතුර හොබවන අතර තෘතියික ප්‍රමිතීන් ඔහු භාරයේ ඇත.)

02. වෙළඳාමේදී භාවිතා කෙරෙන සියලුම පඩි, මිමි, කිරුම් හා මිනුම් උපකරණවල මූලික හා වාර්ෂික සත්‍යායන කටයුතු
03. වෙළඳාමේදී භාවිතා කෙරෙන සියලුම පඩි, මිමි, කිරුම් හා මිනුම් උපකරණ නිෂ්පාදනය කරන්නන්, ආනයනය කරන්නන්, අලුත්වැඩියා කරන්නන් හා අලෙවිකරන්නන් වාර්ෂිකව ලියාපදිංචි කිරීම
04. පනතේ දක්වා ඇති දණ්ඩන විධිවිධාන ක්‍රියාත්මක කිරීම මගින් පාරිභෝගික ආරක්ෂාව සැලසීම
05. නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ වෙළෙන්දන් හා පාරිභෝගිකයන් දැනුවත් කිරීම
06. වෙළඳාමේදී සහ කර්මාන්ත අංශයන්හි භාවිතා කරන කිරුම් හා මිනුම් උපකරණවල මාදිලි අනුමත කිරීම (ජාතික මිනුම් පර්යේෂණාගාරය මෙම සේවාව ලබා දෙයි)
07. පෙර ඇසුරුම් (Pre packages) පරීක්ෂා කිරීම හා පාලනය කිරීම
08. මාර්ග ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ මිනුම් උපකරණ සත්‍යායනය කිරීම
09. වෙළෙඳපොළ වැටලීම් සිදුකර කිරුම්, මිනුම් වංචා කරන පුද්ගලයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම

### 1.6.3.1 තෘතියික ප්‍රමිති නැවත සත්‍යායනය කිරීම

වෙළඳ කටයුතු හා කර්මාන්තවලදී භාවිතා කරන පඩි, මිමි හා කිරුම් මිනුම් උපකරණ සත්‍යායනය කිරීම සඳහා යොදාගන්නා තෘතියික ප්‍රමිතීන් සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් ලේකම්වරයා යටතේ පවත්වාගෙන යයි. එම අංකශෝධන කාර්යය ජාතික මිනුම් පර්යේෂණාගාරයේදී සිදු කරනු ලැබේ. සම්මත පඩි, පරිමා මිනුම් සහ දිග පිළිබඳ මිනුම් මෙම තෘතියික ප්‍රමිතීන් වශයෙන් සලකනු ලැබේ.

### 1.6.3.2 මාදිලි අනුමැතිය

මාදිලි අනුමැතිය යනු කිසියම් පඩියක්, මිම්මක්, කිරුම් හෝ මිනුම් උපකරණයක් නිෂ්පාදකයකු විසින් වෙළඳපොළට එවීමට හෝ ආනයනකරුවකු විසින් ගෙන්වා විකිණීමට පෙර එය ලංකාවේ ක්‍රියාත්මක වන මිනුම් පිළිබඳ නීතිරීතිවලට අනුකූල වන්නේද යන්න සුදුසුකම්ලත් පරීක්ෂණාගාරයකින් පරීක්ෂා කරවාගෙන අනුමත කර ගැනීමයි. මාදිලි අනුමත කිරීම තාක්ෂණික පරීක්ෂාවක් වේ. එහිදී මිනුම් උපකරණයේ මූලාකෘතිය ජාතික මිනුම් පර්යේෂණාගාරයේදී සම්පූර්ණ පරීක්ෂාවට ලක් කෙරේ. එහිදී මිනුම් උපකරණයේ එක් එක් කොටස් නිර්මාණය කර ඇති ආකාරය අන්තර් ජාතික නෛතික මිනුම් විද්‍යා සංවිධානයේ (International Organization of Legal Metrology, OIML) නිර්ණායක වලට අනුකූලද යන්න සොයා බැලේ. පරීක්ෂණ ප්‍රතිඵල ඇගයීම මත පදනම්ව පඩි, වාහන විමෝචන පරීක්ෂණ ඒකක සහ ඉන්ධන පිරවුම් යන්ත්‍ර ඇතුලු මිනුම් උපකරණ සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (MUSSD) විසින් මාදිලි අනුමැතිය ලබා දෙනු ලැබේ.

### 1.6.3.3 දිස්ත්‍රික් මට්ටමින් මෙහෙයවන කිරුම් හා මිනුම් උපකරණ සත්‍යායනය කිරීම, පරීක්ෂණ හා වැටලීම්

රට තුළ භාවිතා වන පඩි, මිමි, කිරුම් හා මිනුම් උපකරණ, මිනුම් නීතිරීතිවලට අනුකූලව පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ හා වැටලීම් සිදු කරනු ලැබේ .මෙම වැඩසටහන් පාරිභෝගික ආරක්ෂාවට මෙන්ම රට තුළ නිවැරදි මිනුම් පද්ධතියක් පවත්වාගෙන යාමටත් උපකාරී වේ. වෙළඳාමේදී භාවිතා වන කිරුම් හා මිනුම් උපකරණ සත්‍යායන කටයුතු සිදු කරනු ලබන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටුවා ඇති මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශවල සේවයේ නියුතු මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකවරුන් (Inspectors of Measurement Service and Devices) විසිනි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හෝ වෙනත් රාජ්‍ය ආයතනවල සත්‍යායන මධ්‍යස්ථාන පිහිටුවා දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව මෙම කටයුතු සිදු කරනු ලැබේ. තවද සෑම දිස්ත්‍රික්කයකම පිහිටා ඇති පාලම් තරාදි ද වසරක් පාසා මුද්‍රා කිරීම සඳහා පාලම් තරාදි පරීක්ෂා කිරීමේ ජංගම ඒකකයක් (Weighbridge Verification Unit) පිහිටුවා තිබේ. රට පුරා ඉන්ධන පිරවුම්හල්වල පිහිටි ඉන්ධන නිකුත් කිරීමේ යන්ත්‍ර ද වසරකට වරක් සත්‍යායනය කිරීම සඳහා ජංගම ඒකකයක් ( Fuel Dispensers Verification Unit) පිහිටුවා ඇත. තවද වාහන වල වේගය මනින හා දුම්මාන පරීක්ෂාව සිදු කරනු ලබන උපකරණ සත්‍යායන සේවා පවත්වාගෙන යනු ලබයි.

### 1.6. 3.4 පෙර ඇසුරුම් භාණ්ඩ පරීක්ෂා කිරීම

පාරිභෝගිකයාට අලෙවි කිරීමට පෙර ඇසුරුම් කරන ලද භාණ්ඩ පෙර ඇසුරුම් භාණ්ඩ (Pre – Packages) ලෙස හැඳින්වේ .පෙර ඇසුරුම් අයිතමයන්ගේ සඳහන්ව ඇති ප්‍රමාණයන් (බර, පරිමාව,දිග ආදිය) නියමිත පරිදි තිබෙන බව පරීක්ෂා කිරීමේදී නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යාන්තර සම්මුතීන්ට (OIML regulations) අනුව පරීක්ෂණ සිදු කෙරේ. පෙර ඇසුරුම් පරීක්ෂා කිරීමේදී වෙළඳ පොළේ ප්‍රදර්ශනයට තබා ඇති පෙර ඇසුරුම් , නියදි ලෙස තෝරා ගෙන ඒවායේ අඩංගු ද්‍රව්‍ය වල ශුද්ධ බර, ශුද්ධ පරිමාව හෝ දිග මනිනු ලැබේ . නිශ්චිත පෙර ඇසුරුම් සංඛ්‍යාවක් එලෙස පරීක්ෂා කර එම මිනුම් සංඛ්‍යාන විශ්ලේෂණයකට (Statistical Analysis) ලක් කරනු ලැබේ . දෙපාර්තමේන්තුව මඟින් වරින් වර නිකුත් කරන විශේෂ ගැසට් නිවේදන වල දක්වා ඇති රෙගුලාසි වලට අනුකූලව පෙර ඇසුරුමේ ශුද්ධ මිනුම ඉඩදිය හැකි දෝෂය සමඟ පරීක්ෂා කර බලා අදාල පෙර ඇසුරුම් පිළිබඳ අවසන් තීරණය ගනු ලැබේ .පෙර ඇසුරුම් පිළිබඳ තොරතුරු 2007.05.29 දිනැති අංක 1499/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

## 1.6.3.5 නෛතික මිනුම් විද්‍යාවෙන් පාලනය වන වාණිජ ක්‍රියාකාරකම්වල නියැලෙන පෞද්ගලික ව්‍යවසායකයින්ගේ ලියාපදිංචිය

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 21 වැනි වගන්තියට අනුව යම් පඩියක්, මිම්මක් හෝ කිරුම් හා මිනුම් උපකරණ විකිණීම, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම හෝ අලුත්වැඩියා කරනු ලබන ඕනෑම සංවිධානයක් හෝ පුද්ගලයෙකු ඒ සඳහා දෙපාර්තමේන්තුවේ නම් ලියාපදිංචි කරවා ගත යුතුය. ඒ සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන ආකෘති පත්‍රයක් මඟින් ඉල්ලුම් කල යුතු අතර එයට නියමිත ගාස්තුවද ගෙවිය යුතුය. මෙවැනි ලියාපදිංචි කිරීමකදී ලබා දෙන සහතිකය එය නිකුත් කළ වසරේ දෙසැම්බර් 31 දිනෙන් අවලංගු වේ.

කිසියම් පුද්ගලයක් කිරුම් හෝ මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ප්‍රථම තමන් ඒ සඳහා තිබිය යුතු සුදුසුකම් හා දක්ෂතා සම්පූර්ණ කර ඇති බව පෙන්වීම පිණිස දෙපාර්තමේන්තුව විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ඒ සඳහා නියමිත විභාග ගාස්තුද ගෙවිය යුතුය.

පඩි, මිමි, කිරුම් හෝ මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීමේදී අවශ්‍ය වන මෙවලම් හා උපකරණ අයදුම්කරු සතුව තිබේද යන්න පරීක්ෂා කරනු ලැබේ. ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් අදාළ අයදුම්කරුගේ වැඩපොළ/ කර්මාන්ත ශාලාව පරීක්ෂා කරනු ලැබේ.

එවැනි ස්ථාන පරීක්ෂාවකින්ද පසු සියලු පරීක්ෂණ පිළිබඳ අධ්‍යක්ෂවරයා සෑහීමකට පත්වන්නේ නම් අදාළ පුද්ගලයා වෙත අලුත්වැඩියා කිරීමේ බලපත්‍රය නිකුත් කරනු ඇත. (වගු 15,16) එම සහතිකය අන්සතු කළ නොහැක. ව්‍යාපාරයේ අයිතිකරු වෙනස් වුවහොත් සුදුසුකම් ලත් කාර්මික නිලධාරියෙකු සිටීම අනිවාර්යය වේ.

ලියාපදිංචි ගාස්තු ඇතුළු ලියාපදිංචි කිරීම් පිළිබඳ අනෙකුත් සියලුම තොරතුරු 2015.07.02 දිනැති අංක 1921/54 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

## 1.7 සංවිධාන ව්‍යුහය


සංවිධාන ව්‍යුහය - මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා
දෙපාර්තමේන්තු ප්‍රධානි
සැලසුම් හා ප්‍රගති සමාලෝචන අංශය
අධ්‍යක්ෂ කාර්යාල අංශය
අභ්‍යන්තර විගණන අංශය
දෙපාර්තමේන්තු නියෝජ්‍ය ප්‍රධානි
දිස්ත්‍රික් ලේකම්
ජාත්‍යන්තර සබඳතා අංශය
පුහුණු හා මිනුම් විද්‍යා අධ්‍යාපන අංශය
තොරතුරු තාක්ෂණ අංශය
තොරතුරු හා ප්‍රකාශන අංශය
තත්ව කළමනාකරණ අංශය
දිස්ත්‍රික් මිනුම් විද්‍යා සම්බන්ධීකරණ අංශය
කාර්මික මිනුම් විද්‍යා සම්බන්ධීකරණ අංශය
ජාතික මිනුම් පර්යේෂණාගාරය
මානමිතික මිනුම් විද්‍යා අංශය
උෂ්ණත්වමිතික මිනුම් විද්‍යා අංශය
ස්කන්ධමිතික මිනුම් විද්‍යා අංශය
විද්‍යුත් හා වි.චු. මිනුම් විද්‍යා අංශය
කාලය හා සංඛ්‍යාත මිනුම් විද්‍යා අංශය
රසායනික මිනුම් විද්‍යා අංශය
පරිමාමිතික මිනුම් විද්‍යා අංශය
පීඩනමිතික මිනුම් විද්‍යා අංශය
තෙතමන හා ආර්ද්‍රතා මිනුම් විද්‍යා අංශය
ශක්තිය හා ක්ෂමතා මිනුම් විද්‍යා අංශය
වායුමිතික මිනුම් විද්‍යා අංශය
බලය හා ව්‍යාවර්ත මිනුම් විද්‍යා අංශය
පාලන අංශය
ගිණුම් හා ප්‍රසම්පාදන අංශය
දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25
• සාමාන්‍ය පරිපාලනය
• නඩත්තු හා පහසුකම් කළමනාකරණය
• ඵලදායීතා අංශය
• ප්‍රවාහන
• කිරුම් හා මිනුම් පරීක්ෂණ හා සත්‍යාපනය
• දැනුවත් කිරීම්, වැටලීම් හා අදාළ ක්‍රියාකාරකම්
• වෙළෙඳාම සම්බන්ධ කිරුම් හා මිනුම් යටතේ අනෙකුත් සියලු ක්‍රියාකාරකම්




කාර්ය මණ්ඩල සංවිධාන සටහන

## 1.8 දිස්ත්‍රික් කාර්යාලවල සම්බන්ධතා තොරතුරු

| දිස්ත්‍රික් කාර්යාලය | ලිපිනය | දුරකතන අංක |
|---|---|---|
| **කොළඹ** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නාරාහේන්පිට,කොළඹ 5 | 0112-500987 |
| **ගම්පහ** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | 0332-221664 |
| **කළුතර** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර | 0342-221765 |
| **පුත්තලම** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම | 0322-266189 |
| **කුරුණෑගල** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල | 0372-228770 |
| **කෑගල්ල** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල | 0352-221323 |
| **රත්නපුර** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර | 0452-226299 |
| **ගාල්ල** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල | 0912-231211 |
| **මාතර** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර | 0412-237079 |
| **හම්බන්තොට** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට | 0472-256160 |
| **මොනරාගල** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොනරාගල | 0552-277406 |
| **බදුල්ල** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල | 0552-228200 |
| **නුවරඑළිය** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය | 0522-235703 |
| **මහනුවර** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර | 0812-239971 |
| **මාතලේ** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ | 0662-222135 |
| **අනුරාධපුර** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර | 0252-225190 |
| **පොලොන්නරුව** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොලොන්නරුව | 0272-226706 |
| **මඩකලපුව** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව | 0652-226584 |
| **අම්පාර** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර | 0632-222982 |
| **වව්නියාව** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වව්නියාව | 0242-224816 |
| **යාපනය** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය | 0212-217399 |
| **මුලතිවු** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මුලතිව් | - |
| **මන්නාරම** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම | 0242-224816 |
| **කිලිනොච්චිය** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චි | - |
| **ත්‍රිකුණාමලය** | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය | 0262-050800 |

වගුව අංක 5

## 1.9 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු




### 1.9.1 සාමාජිකත්ව

මිනුම් විද්‍යාවට අදාළ අන්තර්ජාතික හා කලාපීය සහයෝගීතාව පවත්වා ගැනීම සඳහා විවිධ රටවල් එකිනෙකා සමඟ මිනුම් විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් සම්බන්ධතා ඇතිකරගනු ලැබේ. ජාත්‍යන්තරය සමඟ මිනුම්වල අන්වේෂණතාව ස්ථාපිත කිරීමට සහ වෙළඳාමේ දී ඇති වන තාක්ෂණික බාධක ජය ගැනීමට ද එය උපකාරී වේ. අප සතුව ඇති විද්‍යාත්මක හා වෙනත් මිනුම් පිළිවෙත් සඳහා ආරක්ෂිත වූ පදනමක් සැපයීම සහ බොහෝ රටවල පැන නඟින තාක්ෂණික ගැටළු අවම කිරීම සඳහා ජාත්‍යන්තර සබඳතා තවදුරටත් අත්‍යවශ්‍ය වේ.

**මීටර් සම්මුතියේ හා පඩි හා මිමි පිළිබඳ මහ සම්මේලනයේ ආශ්‍රිත සාමාජිකත්වය**

මීටර් සම්මුතිය යනු මිනුම් පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් ඒකමිතියක් පවත්වා ගැනීම සඳහා 1875 දී රටවල් 17 ක සහභාගීත්වයෙන් පවත්වන ලද සම්මේලනයකි. මීටර් සම්මුතිය මගින් පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනය (CGPM), සහ එහි අධිකාරිය යටතේ පඩි හා මිමි පිළිබඳ ජාත්‍යන්තර කමිටුව (CIPM) ආරම්භ වන අතර අන්තර් රාජ්‍ය සංවිධානයක් වන ජාත්‍යන්තර පඩි හා මිමි කාර්යංශය (BIPM) නිර්මාණය වන්නේද මෙම ගිවිසුම යටතේය.

පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනය, සාමාජික රාජ්‍යයන්හි නියෝජිතයන්ගෙන්ද ආශ්‍රිත සාමාජිකයන්ගෙන්ද නිරීක්ෂකයන්ගෙන්ද සමන්විතය. පඩි හා මිමි පිළිබඳ මහ සම්මේලනය සාමාන්‍යයෙන් වසර හතරකට වරක් පැරිසියේදී හමුවේ. එහි ප්‍රධාන කාර්යයක් වනුයේ ජාත්‍යන්තර ඒකක ක්‍රමයේ (SI) පැවැත්ම හා ප්‍රවර්ධනය සහතික කිරීම සඳහා අවශ්‍ය සාකච්ඡා හා පරීක්ෂණ පැවැත්වීමය.

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මීටර් සම්මුතිය සඳහා අත්සන් කළ අතර 2007දී පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනයේ ආශ්‍රිත සාමාජිකත්වය (Associate Member) ලබා ගත්තේය.

## CIPM අනොන්‍යා පිළිගැනීම පිළිබඳ විධිවිධාන (CIPM-MRA) අත්සන් කිරීම.

CIPM අනොන්‍යා පිළිගැනීම පිළිබඳ විධිවිධාන (CIPM – MPA) යනු ජාතික මිනුම් විද්‍යා ආයතන විසින් පවත්වාගෙන යනු ලබන මිනුම් ප්‍රමිතීන්ගේ හා ඔවුන් විසින් නිකුත් කරනු ලබන අංකශෝධන සහතික වල සමානාත්මතාවය ජාත්‍යන්තර වශයෙන් ප්‍රදර්ශනය කර ගැනීම සඳහා ඇති කර ගනු ලැබූ ගිවිසුමයි.

මෙහි ප්‍රතිඵලය වනුයේ ගිවිසුමට සම්බන්ධ වූ ආයතනයන්හි අන්තර්ජාතිකව පිළිගනු ලබන (අන්තර් ජාතික සමාලෝචකයන්ගේ අනුමැතිය ලැබූ ) අංකශෝධන හා මිනුම් පිළිබඳ හැකියාවන්ගේ අගයන්ය (Calibration and Measurement Capabilities, CMC). අනුමත කරන ලද එම අගයන් හා තවත් තාක්ෂණික තොරතුරු (BIPM) වෙබ් අඩවියේ ඇති මූලික සංසන්දන දත්ත සමුදායේ, KCDB ප්‍රසිද්ධ කර ඇත. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව 2007දී CIPM - MRA ගිවිසුම අත්සන් කළ අතර, අංකශෝධන හා මිනුම් පිළිබඳ හැකියා අගයන් (CMC) KCDB හි ප්‍රසිද්ධ කිරීම සඳහා පියවර ගනිමින් සිටී.

## නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (OIML) පූර්ණ සාමාජිකත්වය

නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය යනු වෙළඳ අවහිරතා හා ලෝක වෙළඳ පොළෙහි වියදම් අවම කිරීම ආදිය සඳහා නෛතික මිනුම් විද්‍යා අධිකාරීන් හා කර්මාන්ත මගින් අනොන්‍යා වශයෙන් පිළිගනු ලබන රෙගුලාසි, ප්‍රමිති හා අනෙකුත් අදාල ලේඛන සැදීම සඳහා ඇතිකරනු ලැබූ අන්තර් රාජ්‍ය බැඳීමකි. නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ සංවිධානය ලෝක වෙළඳ සංවිධානයෙහි වෙළඳ ගිවිසුමෙහි තාක්ෂණික අවහිරතා පිළිබඳ "අන්තර් ජාතික ප්‍රමිති පිහිටුවන ආයතනය" ලෙස සැළකිය හැකිය. එම නිසා වෙළඳාම සහ වෙළඳ අවහිරතාව පිළිබඳ ගිවිසුම අත්සන් කර ඇති සියළු රටවල් විසින් OIML ප්‍රකාශ ඔවුන්ගේ තාක්ෂණික රෙගුලාසි සැදීමේදී සැළකිල්ලට ගත යුතුය.

නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර කමිටුව (CIML) යනු OIML හි තීරණ ගන්නා මණ්ඩලය වේ. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව OIMLහි පූර්ණ සාමාජිකත්වය දරණ අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් ස්ථිර සම්බන්ධිත ආයතනයද වේ .

## ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහන් (APMP) පූර්ණ සාමාජිකත්වය

ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහන යනු සාමාජික රටවල් අතර ප්‍රවීණතාව හා තාක්ෂණික සේවා හුවමාරු කරගනිමින් කලාපීය මිනුම් විද්‍යාත්මක හැකියාවන් වැඩිදියුණු කරගැනීම සඳහා ජාතික මිනුම් විද්‍යා ආයතන වලින් සැදුනු සංවිධානයකි. තවද APMP යනු මිනුම් ප්‍රමිති හා ක්‍රමාංකන සහ මිනුම් සහතික ලෝකය පුරා අනෝන්‍ය වශයෙන් පිළිගැනීම ලබා ගැනීම සඳහා සිදුකරනු ලබන ක්‍රියාවලියේදී පඩි හා මිම් පිළිබඳ ජාත්‍යන්තර කමිටුවේ (CIPM) හි පිළිගත් ආසියා ශාන්තිකර කලාපීය මිනුම් විද්‍යා සංවිධානයි.

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව 1977 සිට ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනෙහි පූර්ණ සාමාජිකත්වය දරයි. දෙපාර්තමේන්තුව තාක්ෂණික කමිටු 9 ක් හා කේන්ද්‍රීය කණ්ඩායම් (focus group) 3කට ක්‍රියාකාරීව සහභාගි වේ.

2021 වසරේ පැවති ආසියා පැසිපික් මිනුම් විද්‍යා වැඩසටහනේදී දියුණුවෙමින් පවතින රටවල් සම්බන්ධ කමිටුවේ **සභාපති ධූරය ප්‍රථම වරට මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්.ඩී.අයි. ඩයස් මහතා**ට 2022 වසරේ සිට වසර 3ක කාලයක් සඳහා හිමිවිය.

## 1.9.2 ව්‍යාපෘතිවල ප්‍රතිලාභ

### PTB- ශ්‍රී ලංකා ද්වි පාර්ශ්වික ව්‍යාපෘතිය

**ශ්‍රී ලංකාවේ ගුණාත්මක යටිතල පහසුකම් ශක්තිමත් කිරීම**

PTB යනු ජර්මනියේ ජාතික මිනුම් ආයතනය (NMI) වේ. එය සංවර්ධනය වෙමින් පවතින හා නැගී එන රටවලට එම රටවල අවශ්‍යතාවන්ට සරිලන පරිදි ජාත්‍යන්තරව පිළිගත් ගුණාත්මක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වේ. PTB - ශ්‍රී ලංකා ද්වි පාර්ශවික ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ උතුරු කලාපයේ පිහිටා ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් (SME) විසින් කරන නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීමේ සේවාවන් වැඩිදියුණු කරවීමයි. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ ප්‍රධාන ව්‍යාපෘති හවුල් පාර්ශවයක් ලෙසට කටයුතු කරනු ලබයි. ජාතික මිනුම් විද්‍යාගාරය සඳහා පුහුණු, උපදේශන සේවා සහ මිනුම් කටයුතු සංවර්ධනය සඳහා මෙම ව්‍යපෘතියෙන් ප්‍රතිලාභ හිමිවේ.

මෙම ව්‍යාපෘතියට ජාතික තත්ත්ව යටිතල ව්‍යුහයේ ප්‍රධාන ආයතන (MUSSD, ITI, SLSI සහ SLAB) මෙන්ම කලාපීය රසායනාගාර, දේශීය මූලස්ථාන සහ උතුරු සහ උතුරු මැද පළාත් සංවිධාන ඇතුලත්ය.

### SAARC - PTB ව්‍යාපෘතිය

**දකුණු ආසියාවේ ගුණාත්මක යටිතල පහසුකම්, ක්ෂේත්‍රයේ කලාපීය ඒකාබද්ධතාවය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම**

සාර්ක් සාමාජික රටවල් අතර විශේෂඥ දැනුම හා තොරතුරු හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම මගින් ගුණාත්මක යටිතල පහසුකම්වල ධාරිතා සංවර්ධනය කෙරෙහි මෙම ව්‍යාපෘතිය අවධානය යොමු කරයි. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් ආයතනය ලෙස SAARC -PTB ව්‍යාපෘතියේ (එනම් පුහුණු වැඩසටහන්, වැඩමුළු) ප්‍රතිලාභියෙකි. තවද, ජාතික මිනුම් පර්යේෂණාගාරයේ (NML) මිනුම් හැකියාව ප්‍රදර්ශනය කිරීම සඳහා SAARC -PTB ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරන ලද අන්තර් සංසන්දනවලට මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව සහභාගී වී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා PTB ආයතනය හරහා ජර්මනියේ ආර්ථික සහයෝගිතා හා සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශය (BMZ) අරමුදල් සපයයි.

### MEDEA-PTB ව්‍යාපෘතිය

ආසියාවේ කලාපීය මිනුම් විද්‍යා විශේෂඥයන් ජාලයේ - ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහන (APMP) සහ ආසියා - ශාන්තිකර නෛතික මිනුම් විද්‍යා සංසදය (APLMF) - සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ගේ මිනුම් විද්‍යාත්මක පද්ධති ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අනුග්‍රාහකත්වය ලබා දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම ව්‍යාපෘතියට ජාතික මිනුම් විද්‍යා ආයතන (NML) හා නෛතික මිනුම් විද්‍යා අධිකාරීන් (LMA) විශේෂ දායකත්වයක් සපයයි. මෙම ව්‍යාපෘතිය සඳහා PTB ආයතනය හරහා ජර්මනියේ ආර්ථික සහයෝගිතා හා සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශය (BMZ) අරමුදල් සපයයි.

## UNIDO ව්‍යාපෘතිය

අනුකූලතාව සහ ගුණාත්මක යටිතල පහසුකම් සේවා ශක්තිමත් කිරීම සඳහා UNIDO ආයතනය ශ්‍රී ලංකාවේ ජාතික තත්ත්ව යටිතල පහසුකම් (NQI) සපයන ආයතන සමඟ සමීපව කටයුතු කරයි. විශේෂ අවධානය යොමු කළ අංශ වන්නේ කුළුබඩු සහ සැකසූ ආහාර වැනි අපනයන අරමුණු කරගත් අංශයි. මෙම ක්‍රියාකාරකම් යුරෝපා සංගමය විසින් අරමුදල් සපයනු ලබන යුරෝපීය සංගමයේ (EU) ශ්‍රී ලංකාවේ වෙළඳාම ආශ්‍රිත ආධාර ව්‍යාපෘති රාමුව තුළ සිදු වේ. UNIDO සංවිධානයේ නව ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය සහ ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා ගුණාත්මක යටිතල පහසුකම් සපයමින් කටයුතු කරයි. මෙම ව්‍යාපෘතියේද මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ප්‍රධාන ව්‍යපෘති හවුල්කරුවෙකු ලෙසට කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මඟින් පුහුණු, උපදේශන සේවා, මිනුම් සංවර්ධන හා විදේශ ආධාර ලෙස මිනුම් විද්‍යාගාර සඳහා උපකරණ ලබාදෙනු ලැබේ.

# 2

# ප්‍රගතිය

## 2.1 ජාතික මිනුම් පර්යේෂණාගාරය තුල මිනුම් අන්වේශණතාව (Measurement Traceability) ස්ථාපනය කිරීම

2021 වසර තුල ජාතික මිනුම් පර්යේෂණාගාරය තුල මිනුම් අන්වේශණතාව ස්ථාපනය පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

| ප්‍රමිතිය/මිනුම | ජාතික මිනුම් විද්‍යා ආයතනය /ආශ්‍රය ප්‍රමිතීන් (Reference Standard) |
|---|---|
| **සම්මත ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමානය** | ජාතික මිනුම් විද්‍යා ආයතනය එක්සත් රාජධානිය (NPL-UK) |
| **කැලිපර් පරීක්ෂකය** | ජාතික මිනුම් විද්‍යා ආයතනය - ඉන්දියාව |
| **OIML El කිරුම් පඩි** | ජාතික මිනුම් විද්‍යා ආයතනය තායිලන්තය (NIMT) |
| **pH මිනුම්** | ද්විතීයික ස්වාරක්ෂක ද්‍රාවණ |
| **සන්නායකතාව** | ද්විතීය ප්‍රමිති සන්නායක ද්‍රාවණ |
| **රුධිරයේ ඇති ඇල්කොහොල් ප්‍රමාණය** | රුධිරයේ මධ්‍යසාර ප්‍රමිති ද්‍රාවණය(Certified Reference Material) |
| **Cs පරමාණු ඔරලෝසුව** | ජාත්‍යන්තර පඩි හා මිමි කාර්යංශය (BIPM) |
| **IV, IOV සෙනර් වෝල්ටීයතා සම්මත (Zener Voltage Standard)** | National Research Council Canada(NRC.CNRC) |
| **අඩු පීඩන සම්මත වායු පීඩන තුලාව පරාසය 175 kPa** | Czech Metrology Institute (CMI) |

වගුව අංක 6

## 2.2 අන්තර් විද්‍යාගාර සංසන්දනය සඳහා සහභාගී වීම (Inter Laboratory Comparisons)

| විද්‍යාගාරය | මිනුම් | අන්තර් සංසන්දනය |
|---|---|---|
| **මානමිතික** | රේඛා පරිමාණ 300 mm, 250 mm | SAARC – PTB වීදුරු පරිමාණ 2021 දී අවසන් කරන ලදි. |
| **පරිමාමිතික** | පරිමාව 100 μL<br>පරිමාව 5 μL - 1000 μL | APMP. M. FF - K4.2.2021<br>SAARC – PTB |
| **උෂ්ණත්වමිතික** | සම්මත ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමානය | APMP.T.HC3 **ද්විපාර්ශවික** NMI සමඟ |
| **කාලය හා සංඛ්‍යාතය** | කාලය හා සංඛ්‍යාතය | CCTF-K001.UTC |
| **පීඩනය** | ද්‍රව පීඩනමානය (700 bar) | කාම්බෝජියාව සමඟ ද්විපාර්ශවික අන්තර් සංසන්දනය සඳහා නියමු විද්‍යාගාරය ලෙස කටයුතු කිරීම. |

වගුව අංක 7

## 2.3 සංවර්ධන කටයුතු - 2021

- සන්නායකතාව (Conduetivity) පිළිබඳ මිනුම් කටයුතු ආරම්භ කිරීම.
- අඩු පීඩන මිනුම් ක්‍රමාංකනය සඳහා සම්මත වායු පීඩන තුලාවක් ස්ථාපිත කිරිම. එමඟින්
  - අඩු පීඩන හා රික්ත පීඩන මාන ක්‍රමාංකන කටයුතු ආරම්භ කිරීම.
  - පරිසර පීඩන තත්වය මැනීමේ උපකරණ (Barometric Pressure Measuring Devices) ක්‍රමාංකනය සඳහා උපකරණ ස්ථාපිත කර ක්‍රමාංකන කටයුතු ආරම්භ කිරීම.
  - පීඩනය පිළිබඳ විද්‍යාගාරයේ අංකශෝධන හා මිනුම් පිළිබඳ ශක්‍යතා අගයන් (CMC), BIPM ආයතනයේ **KCDB (Key Comparison DataBase)** වෙබ් අඩවියේ පළ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට **APMP** වෙත යොමු කිරීම.
- උෂ්ණත්වය පිළිබඳ විද්‍යාගාරය සඳහා පහත සඳහන් ප්‍රමිතීන් මිලදී ගෙන ඇත.
  - සම්මත තාපයුග්ම උෂ්ණත්වමාන 02
  - S type $^0$C to 1100 $^0$C
  - R type $^0$C to 1100 $^0$C
  - ඉහළ නිරවද්‍යතාවයක් ඇති සම්මත ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමාන 02
  - AC/DC සම්මත ප්‍රතිරෝධ (10Ω , 25Ω , 100Ω ) 03
  - Standard Resistor maintenance Bath 01
  - Multi Function Calibration Bath 02
  - High temperature fixed point maintenance Bath 01
  - Millik Thermometers 05
- කාලය හා අධි සංඛ්‍යාතය පිළිබඳ මිනුම් උපකරණ මිලදී ගැනීම.
- නිරෝධනමිතිය යටතේ මිනුම් කටයුතු ආරම්භ කර පවත්වාගෙන යාම.
- වෝල්ටීයතාව පිළිබඳ ප්‍රමිතීන් මිලදී ගෙන ඇත.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ 20(1) (අ) සහ 37 වගන්තිය | වෙළඳාමේදී භාවිතාවන සියලුම මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යාපනය කළ යුතු වුවද, එසේ සෑම උපකරණයක්ම සත්‍යාපනය කරන බව තහවුරු කරගැනීමේ නිසි ක්‍රමවේදයක් අරමුදල තුල ස්ථාපිත කර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රජයේ වාහන සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසු හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළයුතු වුවද වාහන 14 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

අරමුදලෙහි ජංගම ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. මිලියන 99 සිට රු. මිලියන 229 ක් දක්වා පරාසයක ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර මෙම ශේෂය අරමුදලේ මාසික අවශ්‍යතාවය හා සසඳන විට සියයට 51 ක සිට සියයට 97 ක් දක්වා වූ අතිරික්ත මුදලක් බව නිරීක්ෂණය විය. මෙම අතිරික්ත ශේෂය ඵලදායී ලෙස ආයෝජනය කර පොළී ආදායම් උපයා ගත හැකිව තිබුණද, කළමනාකරණය විසින් ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

6

NAOSL ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

**3.3 . වත්කම් කළමනාකරණය**

2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සියලු රාජ්‍ය ආයතන වල ධාවන තත්තවයේ නොපවතින වාහන චක්‍රලේඛයේ 02 (අ) ඡේදය ප්‍රකාරව අපහරණය කිරීම හෝ 02 (ආ) ඡේදය ප්‍රකාරව අලුත්වැඩියා කිරීම 2020 දෙසැම්බර් 31 දිනට පෙර නිම කල යුතු විය.එසේ වුවද අරමුදල සතු වාහනයක් වසර 05 කට වැඩි කාලයක සිට ධාවන තත්ත්වයෙන් ඉවත් කර ඇති අතර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 කාර්යසාධනය**

අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර ගැනීමට සැළසුම් කරන ලද කාර්යන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනික රාමුව ශක්තිමත් කිරීමට අදාල කටයුතුවල සමාලෝචිත වර්ෂයේ ප්‍රගතිය සියයට 10 ක් පමණක් වී තිබුණි.

(ආ) දිස්ත්‍රික්ක 12 ක භාවිතා කරනු ලබන මිනුම් ප්‍රමිත නැවත සත්‍යාක්ෂණය කිරීම සඳහා සැලසුම් කර තිබුණද කිසිදු දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ඇ) ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීම සඳහා අනෙකුත් මිනුම් ආයතන (NQI Bodies) වලට සහය දැක්වීම යන කරුණු යටතේ ඉටුකල යුතු ක්‍රියාකාරකම් කිසිවක් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

**3.5 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

(අ) 2021 පෙබරවාරි 17 දින රු.19,468,582 ක පිරිවැයක් දරමින් මිලදී ගත් CCB – 1000 – SL -1Kg Mass Comparator උපකරණය සවිකිරීමේදී අනාවරණය වූ දෝෂ හේතුවෙන් නැවත සැපයුම්කරු වෙත හරවා යවා තිබුණි. එසේ වුවද 2022 අප්‍රේල් 25 දින වන විටත් අදාල උපකරණය දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබීම හේතුවෙන් ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) කි.ග්‍රෑ. 20 – M1 මිනුම් උපකරණ 50 ක් 2020 දෙසැම්බර් 31 දින රු. 2,803,032 ක පිරිවැයක් දරමින් පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු අතර එම උපකරණ වල පැවති දෝෂ හේතුවෙන් සැපයුම්කරු වෙත නැවත හරවා යවා තිබුණි.කෙසේ වුවද නිවැරදි කරන ලද උපකරණ 15 ක් පමණක් නැවත දෙපාර්තමේන්තුව වෙත නිකුත් කර තිබූ අතර උපකරණ 35 ක් 2022 අප්‍රේල් 25 දින වන විටත් නිවැරදි කර භාර දී නොතිබුණි. එම උපකරණ කඩිනමින් ලබාගෙන අදාල උපකරණ සම්බන්ධයෙන් දරන ලද පිරිවැය සඳහා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

3.6 අයවැය ලේඛනමය පාලනය

Low range gas piston gauge system (1000 psi) සහ Data Logger යන උපකරණ මිළදී ගැනීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. 4,200,000 ක් වුවද ඒ වෙනුවෙන් දරන ලද සත්‍ය පිරිවැය රු. 27,205,857 ක් වී තිබුණි. ඒ අනුව සත්‍ය පිරිවැය ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 648 ක් වී තිබුණි.

ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

8

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීජ්සී/බී/ එම්යූඑස්එස්ඩී/ 2021 / ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්,

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

**මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන් පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල,ඉංග්‍රීසි,දෙමළ) මේ සමඟ එවා ඇත.

බී.ජී.අයි. නිරංජා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත -: අධ්‍යක්ෂ, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීඒසී/බී/ එම්යූඑස්එස්ඩී/ 2021 / 01    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2022 මැයි 31 දින

අධ්‍යක්ෂ

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

**මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් **31** දිනට මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

පිටුව 2 | 9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

පිටුව 3 | 9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූප වී නොතිබුණි.

(i) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.2 වගන්තිය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ,වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් නොකර අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුළ ගැළපීම් කර තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ii) අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් සහ තැන්පතු ලැබීම් හා ගෙවීම් ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය හා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

පිටුව 4 | 9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NAOSL NATIONAL AUDIT OFFICE

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**1.6.1.1 ආදායම් නොවන ලැබීම්**

**තැන්පතු ලැබීම්**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇති තැන්පත් ලැබීම් රු.54,097 ක් දෙපාර්තමේන්තු පොත්වල ඇතුළත් කර නොතිබුණු අතර භාණ්ඩාගාර මුද්‍රිත සහ දෙපාර්තමේන්තු පොත් අතර වූ එම වෙනස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

**1.6.2 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර 52 වගුවේ සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් ලෙස රු.5,277,770 ක් දක්වා තිබුණු අතර දෙපාර්තමේන්තු පොත් අනුව එය රු.5,246,909 ක් විය. රු.30,861 ක් වූ වෙනස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් වටිනාකම රු.988,374 ක් වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු.1,002,511 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.14,137 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් වටිනාකම රු.957,513 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි.

(ඈ) අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් දරන ලද වියදම රු.69,137 ක් වුවද එය රු. 55,000 ක් වශයෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි.

පිටුව 5 | 9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

#### 1.6.3.1 තැන්පතු ගිණුම් ශේෂ

ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු රු. 47,715,046 ක් වූ තැන්පතු ගිණුම් ශේෂය දෙපාර්තමේන්තු පොත් වල සටහන් කර නොතිබුණි.

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

#### 1.6.4.1 මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව අත්තිකාරම් අයකර ගැනීම් වටිනාකම රු.4,275,258 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම ඇතුලත් කර නොතිබුණි.

### 1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් රු.731,500 සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

පිටුව 6 | 9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) | මුදල් රෙගුලාසි 427 (2) | සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම භාණ්ඩාගාර පොත්වල දැක්වෙන ගිණුම් සමග තම දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යන අග්‍රිම ගිණුම් මාසිකව සැසදිය යුතු වුවද, ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ අග්‍රිම ගිණුමෙහි හර ශේෂය සහ මාසික ගිණුම් සාරාංශය අනුව හර ශේෂය අතර රු 29,427 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ අග්‍රිම ගිණුමෙහි බැර ශේෂය සහ මාසික ගිණුම් සාරාංශය අනුව බැර ශේෂය අතර රු 1,100,000ක වෙනසක් නිරීක්ෂණය විය. |
| (ආ) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ඉක්ම වූ රු. 47,715,046 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර එම වාර්තා 2022 මාර්තු 31 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |

පිටුව 7 | 9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයට අදාල වූ මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව 2021 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය ඇතුලත් කර නොතිබුණි.

3.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 ( 2 ) උප වගන්තියට අනුව සෑම අස්ථිත්‍යයක් විසින්ම එහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

4 මානව සම්පත් කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත , තථ්‍ය හා පුරප්පාඩු සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 10 | 09 |
| තෘතියික මට්ටම | 30 | 04 | 26 |
| ද්විතියික මට්ටම | 216 | 180 | 36 |
| ප්‍රාථමික මට්ටම | 103 | 88 | 15 |
| | **368** | **282** | **86** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

පිටුව 8 | 9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(අ) 2021 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 23 ක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 19 ක් වූ අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ සහකාර අධ්‍යක්ෂ තනතුරු 08 ක් එනම් සියයට 42 ක් වසර 10 ක කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවතුණි.

(ඇ) අනුමත තෘතීයික මට්ටමේ තනතුරු 30ක් අතුරින් 26 ක් එනම් සියයට 86 ක් වසර 3 ක කාලයක සිටම පුරප්පාඩුව පැවතුණි. මෙම කාර්ය මණ්ඩල පුරප්පාඩු දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සඳහා අහිතකරව බලපානු ලබන අතර ඒ සම්බන්ධයෙන් සමාලෝචනය කර කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

බී.ජී.අයි. නිරංජා
බී.ජී.අයි. නිරංජා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටුව 9 | 9

# 4

# කාර්යසාධන දර්ශකය

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශකය | වාර්ෂික ඉලක්කය | ලගා කරගත් ප්‍රතිඵලය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| සත්‍යායන ඒකක සංඛ්‍යාව | 600,000 | 419,114 | 69.9% |
| සත්‍යායන ආදායම | 390(මිලියන) | 311(මිලියන) | 79.7% |
| අංකශෝධන ඒකක සංඛ්‍යාව | 1400 | 854 | 61% |
| අංකශෝධන ආදායම | 2.5(මිලියන) | 3.1(මිලියන) | 124% |
| පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව | 06 | 02 | 33.3% |
| පුහුණු වැඩ සටහන් ආදායම | 0.4 (මිලියන) | 0.03(මිලියන) | 7.5% |
| මාදිලි අනුමැති සංඛ්‍යාව | 45 | 19 | 42.2% |
| මාදිලි අනුමැති ආදායම | 1(මිලියන) | 0.81(මිලියන) | 81% |
| පෞද්ගලික ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව | 600 | 613 | 102.1% |
| පෞද්ගලික ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම් ආදායම | 1.3(මිලියන) | 1.6(මිලියන) | 123% |
| පෙර ඇසුරුම් භාණ්ඩ පරීක්ෂණ සංඛ්‍යාව | - | - | - |
| වැටලීම් සංඛ්‍යාව | 16,600 | 8,220 | 49.5% |
| දැනුවත් කිරීම් වැඩසටහන් සංඛ්‍යාව | 900 | 536 | 59.6% |

# 5

# තිරසාර සංවර්ධන අරමුණු (SDG)

## 5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | කාර්යසාධන දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|
| | | | 0% -49% | 50%- 74% | 75%- 100% |
| **අරමුණ 01**<br>**දුප්පත්කම දුරලීම** | • කුඩාම වෙළඳපොළවල පවා වෙළඳ සුරක්ෂිතතාවයක් ඇති කිරීම සියළුම ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා නිවැරදි ගෙවීමක් ලබා දෙන බවට සහතික වනු ඇත.<br>• නිවැරදි මිනුම මගින් ගෙවන ලද මිල පමණක් නොව, අපනයන සඳහා නිවැරදි බදු එකතු කිරීමට රජයන්ට හැකි බව සහතික වීම.<br>• පෙර ඇසුරුම් කළ භාණ්ඩ පාලනය කිරීම තුලින් ප්‍රධාන වශයෙන් ආහාර ද්‍රව්‍ය පෙර ඇසුරුම් කිරීම වැඩිවෙමින් පවතින අවස්ථාවක ක්ෂේත්‍රයේ වංචා අවම කිරීමට උපකාරී වීම. | වසර තුළ ඉලක්ක ගත සත්‍යායනය කල ඒකක ප්‍රමාණය<br><br>වසර තුල අධීක්ෂණය කිරීමට බලාපොරොත්තු වූ පෙර ඇසුරුම් කළ භාණ්ඩ ප්‍රමාණය | | 70% | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **අරමුණ 03**<br><br>**යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම** | • සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම,<br>• "ව්‍යාජ ධනාත්මක" සහ "ව්‍යාජ-ඍනාත්මක" පරීක්ෂණ ප්‍රතිඵල අවම කිරීම<br>• රජයේ සහ සෞඛ්‍ය රක්ෂණකරුවන් සඳහා වන පිරිවැය අඩු කිරීම සහ සෞඛ්‍ය සේවයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.<br>• ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හේතුවෙන් පුනරාවර්තන පරීක්ෂණ සංඛ්‍යාව අඩු කිරීම<br>• ගුණාත්මක බවින් යුත් රෝග විනිශ්චය සඳහා වන පිරිවැය අඩු කිරීම . | වසර තුළ සෞඛ්‍ය අංශයට අදාල උපකරණ සත්‍යායනය හෝ අංකශෝධනය කිරීමට බලාපොරොත්තු වූ ඒකක ප්‍රමාණය | | සීමිත සංඛ්‍යාවක් සිදුකර ඇත. (ඉල්ලීම මත සිදු කරයි) | | |
| **අරමුණ 07**<br><br>**දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය** | • පරිසරයට නිකුත්වන $CO_2$ හා අනෙකුත් නුසුදුසු විමෝචන පාලනය කිරීම | වසර තුල සත්‍යායනයට ලක්කල දුම් මාන ප්‍රමාණය | | **590** | | |
| **අරමුණු 09**<br><br>**කර්මාන්ත නවෝත්පාදන හා යටිතල පහසුකම්** | • කොටස් සහ නිමි භාණ්ඩ නිශ්පාදනයේදී ගුණාත්මකභාවය තහවුරු කරන නියාමන අවශ්‍යතා, ලේඛන ප්‍රමිතීන් සහ පිරිවිතරයන් සපුරාලීම.<br>• නිෂ්පාදන වටිනාකම සහ විශ්වසනීයත්වය ඇතුළුව පාරිභෝගික හා කාර්මික ගුණාත්මක අපේක්ෂාවන් සපුරාලීම. | වසර තුල ඉලක්කගත අංකශෝධන ප්‍රමාණය<br><br>වසර තුල ඉලක්කගත CIMP MRA අවශ්‍යතා සපුරාලීම සඳහා ගත් ක්‍රියාමාර්ග | | **854** | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | • CIMP MRA අවශ්‍යතා සපුරාලීම මඟින් වාණිජ පරීක්ෂණාගාර සඳහා ප්‍රමිතිකරණය ලබා ගැනීමට සහය වීම හා මිනුම් සහ පරීක්ෂණ ප්‍රතිඵල ජාත්‍යන්තරව පිළිගැනීම මඟින් නැවත නැවත පරීක්ෂා කිරීමෙන් තොරව වෙළඳ බාධක වළක්වා ගැනීම. | | | | |

# 6
# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය - කාර්ය මණ්ඩල සංයුතිය – 2021

| තනතුර | වැටුප් කාණ්ඩය | සේවා ගණය | පන්තිය | අනුමත තනතුරු සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | | | පවතින පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | කොන්ත්‍රාත් | වැඩ බලන | |
| **ජ්‍යෝෂ්ඨ** | | | | | | | | |
| **මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ** | SL-1-2016 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | I | 01 | 01 | - | - | - |
| **මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ** | SL-1-2016 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | III/II/I ඒකාබද්ධ | 15 | 07 | - | - | 08 |
| **සහකාර අධ්‍යක්ෂ (පාලන)** | SL-1-2016 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | III | 01 | 01 | - | | - |
| **ගණකාධිකාරි** | SL-1-2016 | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | II/I , II/II | 01 | 01 | - | - | - |
| **ගණකාධිකාරි(අභ්‍යන්තර විගණන)** | SL-1-2016 | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | II/I , II/II | 01 | - | | - | 01 |
| **තෘතියික** | | | | | | | | |
| **පරිපාලන නිලධාරි** | MN-7-2016 | කළමණාකරණ සේවා නිලධාරී සේවය (අධි ශ්‍රේණිය) | විශේෂ | 01 | - | - | - | 01 |
| **සහකාර මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධිකාරි** | MN-7-2016 | දෙපාර්තමේන්තුගත | | 04 | - | - | - | 04 |
| **මිනුම් සේවා උපක්‍රම පරීක්ෂක** | MN-7-2016 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (අධි ශ්‍රේණිය) | විශේෂ | 25 | 04 | - | - | 21 |

| තනතුර | වැටුප් කාණ්ඩය | සේවා ගණය | පන්තිය | අනුමත තනතුරු සංඛ්‍යාව | තත්ව සේවක සංඛ්‍යාව | | | පවතින පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | කොන්ත්‍රාත් | වැඩ බලන | |
| **ද්විතීය** | | | | | | | | |
| **මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරි** | MN-4-2016 | දෙපාර්තමේන්තුගත | | 36 | 18 | - | - | 18 |
| **දිස්ත්‍රික් මිනුම් විද්‍යා විමර්ෂණ සහකාර** | MN-4-2016 | දෙපාර්තමේන්තුගත | | 03 | 03 | - | - | - |
| **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි** | MN-6-2016 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | | 01 | | - | - | 01 |
| **සංවර්ධන නිලධාරි** | MN-4-2016 | සංවර්ධන නිලධාරි සේවය | | 60 | 53 | - | - | 07 |
| **පුස්තකාලයාධිපති** | MN-3-2016 | ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය | | 01 | - | - | - | 01 |
| **මිනුම් සේවා උපක්‍රම පරීක්ෂක** | MN-3-2016 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | III/II/I | 91 | 86 | - | - | 05 |
| **රසායනාගාර සහකාර** | MN-3-2016 | දෙපාර්තමේන්තුගත | | 04 | 01 | - | - | 03 |
| **කළමණාකරණ සේවා නිලධාරී** | MN-2-2016 | කළමණාකරණ සේවා නිලධාරී සේවය | | 20 | 19 | - | - | 01 |

| තනතුර | වැටුප් කාණ්ඩය | සේවා ගණය | පන්තිය | අනුමත තනතුරු සංඛ්‍යාව | තත්ව සේවක සංඛ්‍යාව | | | පවතින පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | අනියම් | වැඩ බලන | |
| ප්‍රාථමික | | | | | | | | |
| **කාර්මික ශිල්පී** | PL3-2016 | දෙපාර්තමේන්තුගත | | 02 | - | - | - | 02 |
| **යාන්ත්‍රික ශිල්පී** | PL3-2016 | දෙපාර්තමේන්තුගත | | 02 | 02 | - | - | - |
| රියදුරු | PL3-2016 | ඒකාබද්ධ සේවය | | 17 | 17 | - | - | - |
| **මිනුම් ප්‍රමිති සේවා සහායක** | PL2-2016 | දෙපාර්තමේන්තුගත | | 63 | 55 | - | - | 08 |
| **රසායනාගාර සහායක** | PL2-2016 | දෙපාර්තමේන්තුගත | | 10 | 07 | - | - | 03 |
| **ලොරි සහායක** | PL1-2016 | දෙපාර්තමේන්තුගත | | 02 | 02 | - | - | - |
| **කාර්යාල කාර්ය සහායක** | PL1-2016 | දෙපාර්තමේන්තුගත හා ඒකාබද්ධ සේවය | | 05 | 05 | - | - | - |
| මුරකරු | PL1-2016 | දෙපාර්තමේන්තුගත | | 01 | - | - | - | 01 |
| **සනීපාරක්ෂක කම්කරු** | PL1-2016 | දෙපාර්තමේන්තුගත | | 01 | - | - | - | 01 |
| එකතුව | | | | **368** | **282** | **-** | **-** | **86** |

## 6.2 මානව සම්පත් සංවර්ධනය

ආයතනය තුල රාජකාරී කටයුතු කරගෙන යාමේදී ඊට අදාල වන්නා වූ දැනුම නිලධාරීන්ට ලබා දීම හේතුවෙන් ආයතනයේ රාජකාරී කටයුතු වෙනදාට වඩා කාර්යක්ෂමව හා නිවැරදිව ඉටු කිරීමට හැකියාව ලැබෙන අතර ඒමඟින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වැඩිවේ.

| අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු’000) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම /ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | **දේශීය** | **විදේශීය** | | |
| **01** | රාජ්‍ය නිලධාරීන් සඳහා MS Excel උසස් නිපුණතා පාඨමාලාව | 7 | 2021.03.30<br>2021.03.31 | රු.91,000.00 | | දේශීය | MS Excel පිළිබඳ දැනුම |
| **02** | සාක්ෂි නීති පුහුණුව | 25 | 2021.07.07<br>2021.07.16 | රු.60,000.00 | | දේශීය | සාක්ෂි නීති සම්බන්ධ දැනුම |
| **03** | MS Excel පරිගණක පාඨමාලාව | 1 | 2021.06.23 | රු.2,000.00 | | දේශීය | මූලික දැනුම |
| **04** | මුදල් රෙගුලාසි<br>(මාර්ගගත) | 85 | 2021.06.03 | රු.20,000.00 | | දේශීය | මුදල් රෙගුලාසි යටතේ අදාළ දැනුම |
| **05** | විධිමත් ලිපි ලිවීම සම්බන්ධ පුහුණුව | 6 | 2021.03.15<br>2021.03.18 | රු.30,000.00 | | දේශීය | විධිමත් ලිපි ලිවීම සම්බන්ධ දැනුම |
| **06** | බඩුතොග කළමනාකරණය | 2 | 2021.03.30<br>2021.03.31 | රු.7,500.00 | | දේශීය | බඩුතොග කළමනාකරණය සම්බන්ධ දැනුම |

| අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු'000) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම /ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| **07** | නීතිය සම්බන්ධ පුහුණුව (මාර්ගගත) | 20 | 2021.07.13<br>2021.10.12 | රු.180,000.00 | | දේශීය | රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය නීතිමය කරුණු |
| **08** | ආලෝක ආරක්ෂණය පෘථිවිකරණය සහ උත්පාත ආරක්ෂාව | 4 | 2021.04.22 | රු .34,000.00 | | දේශීය | ඊට සම්බන්ධ දැනුම |
| **09** | Ms Access පුහුණුව | 3 | 2021.10.27<br>2021.10.28 | රු.10,500.00 | | දේශීය | Ms Access සම්බන්ධ දැනුම |
| **10** | පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය | 3 | 2021.03.31 | රු.11,400.00 | | දේශීය | පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ දැනුම |
| **11** | ධනාත්මක චින්තනය හා චිත්තවේග කළමණාකරණය | 257 | 2021.06.16 | රු.15,000.00 | | දේශීය | ධනාත්මක චින්තනය හා චිත්තවේග කළමණාකරණය සම්බන්ධ දැනුම |
| **12** | රසවින්දන වැඩසටහන | 87 | 2021.09.17 | රු.15,000.00 | | දේශීය | - |
| **13** | අපජල කළමණාකරණය | 1 | 2021.07.29 | රු.5,000.00 | | දේශීය | ඒ හා සම්බන්ධ දැනුම |
| **මුළු පිරිවැය** | | | | **රු.481,400.00** | | | |

# 7

# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| **1.1** | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | නියමිත දිනට ඉදිරිපත් කර ඇත. | |
| **1.2** | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| **1.3** | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | අනුකූල නොවේ | මෙම දෙපාර්තමේන්තුවට අදාල නොවේ. | |
| **1.4** | ගබඩා අත්තිකාරම් ගිණුම | අනුකූල නොවේ | | |
| **1.5** | විශේෂ අත්තිකාරම් ගිණුම | අනුකූල නොවේ | | |
| **1.6** | වෙනත් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල | අනුකූල වේ | නියමිත දිනට ඉදිරිපත් කර ඇත. | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| **2.1** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | නියමිත ලෙස යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි | |
| **2.2** | පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.3** | විගණන ගිණුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.4** | අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **2.5** | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **2.6** | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.7** | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.8** | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.9** | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.10** | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | බැරකම් නොමැති නිසා ලේඛනයක් නඩත්තු කරනු නොලබයි. | |
| **2.11** | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම** (මු.රෙ . 135) | | | |
| **3.1** | මූල්‍ය බලතල ආයතනය තුල පවරා දී තිබීම | අනුකූල වේ | නියමිත ලෙස බලය පවරා දි ඇත. | |
| **3.2** | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| **3.3** | සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම | අනුකූල වේ | | |
| **3.4** | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| **4.1** | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | නියමිත දිනට ඉදිරිපත් කර ඇත. | |
| **4.2** | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| **4.3** | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| **4.4** | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (MBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **4.5** | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **4.6** | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (MBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **4.7** | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| **5.1** | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ | නියමිත දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු දී ඇත. | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| **6.1** | මු.රෙ . 134(2) DMA/1-2020 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| **6.2** | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක | අනුකූල නොවේ | පිළිතුරු ලැබී නොමැත | ඉදිරියේදී අදාළ කාලසීමාව තුළ පිළිතුරු යැවීමට |

| | | | | |
|---|---|---|---|---|
| | කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | | | නිලධාරින් දැනුවත් කරන ලදි |
| **6.3** | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **6.4** | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| **7.1** | DMA චක්‍රලේඛ 1-2020 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | Covid වසංගතය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය. | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| **8.1** | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **8.2** | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම. | අනුකූල නොවේ. | නිලධාරියෙකු පත්කර නොමැත | නිලධාරියෙකු පත්කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම |
| **8.3** | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල නොවේ. | Covid වසංගතය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය. | 2022 වර්ෂයේ සිට නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර වාර්තා ඉදිරිපත් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල නොවේ. | | මේ සඳහා කමිටුවක් පත්කර අතිරික්ත ඌණතා සම්බන්ධයෙන් වාර්තා ලබා ගැනීම. |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ. | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල නොවේ | තීරණයක් ගෙන නොමැත | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූලයි | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම. | අනුකූල වේ | 2021 සිට ක්‍රියාත්මක වේ. | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| **10.2** | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | අක්‍රිය බැංකු ශේෂ නිරවුල් කරමින් පවති. | |
| **10.3** | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වු හා ගැලපුම් කළ යුතුව තිබු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | ශේෂ ගැලපුම් නිරවුල් කරමින් පවතී. | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| **11.1** | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | | |
| **11.2** | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල නොවේ | | |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| **12.1** | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| **12.2** | හිඟහිට් ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| **12.3** | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ අයකරගෙන නොතිබීම | නීතිපති වෙත දන්වා ඇත. අදාළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට තවදුරටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| **13.1** | කල් ඉකුත් වු තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | තැන්පත් ගිණුමේ ශේෂයක් නැත | |
| **13.2** | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | තැන්පත් ගිණුමේ ශේෂයක් නැත | |

| | | | | |
|---|---|---|---|---|
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| **14.1** | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| **14.2** | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **14.3** | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| **14.4** | අග්‍රිම ගිණුමේ ශේෂය,භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| **15.1** | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකර තිබීම | අනුකූල නොවේ | | |
| **15.2** | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල නොවේ | | |
| **15.3** | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| **16.1** | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **16.2** | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **16.3** | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| **17.1** | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **17.2** | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබද මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| **17.3** | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| **18.1** | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| **18.2** | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු | අනුකූල නොවේ | | කාර්යසාධන ගිවිසුමක් ක්‍රියාත්මක නොවන අතර ඇගයීම සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | | | ක්‍රමවේදයක් සකස්කර ඇත. |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම** | | | |
| **19.1** | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19.2** | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| **19.3** | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | | කාර්යසාධන ගිවිසුමක් ක්‍රියාත්මක නොවන අතර, ඇගයීම සඳහා ක්‍රමවේදයන් සකස් කර ඇත. |
| **19.4** | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| **20.1** | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | විගණන නිරීක්ෂණ සකස් කර ඇත. | |